





# ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව

## இறக்குமதி மற்றும் ஏற்றுமதி கட்டுப்பாடுத் திணைக்களம்

## Department of Imports & Exports Control

# කාර්යසාධන වාර්තාව - 2021

වැය ශීර්ෂය - 296

## මුදල් අමාත්‍යාංශය

### ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව



## පාලක ජනරාල්ගේ පණිවුඩය

ආනයන හා අපනයන පාලක ජනරාල් වශයෙන් 2021 මුදල් වර්ෂය සඳහා දෙපාර්තමේන්තුව විසින් සැලසුම් ගත අරමුණු වෙත ළඟා වීමේ ප්‍රගතිය ඇතුළත් “ කාර්යසාධන වාර්තාව - 2021 “ ඉදිරිපත් කිරීමට ලැබීම පිළිබඳ මා සතුටට පත්වෙමි.

1969 අංක 1 දරන ආනයනය හා අපනයන පාලන පනතින් ස්ථාපිත කරන ලද මෙම දෙපාර්තමේන්තුව "යහපත් අනාගතයක් උදෙසා පරිසරය සහ මහජනතාව සුරක්ෂිත කිරීම" යන පුළුල් දැක්ම කරා ළඟා වීමට අවශ්‍ය ඉලක්කයන් සපුරා ගනිමින් අභිමානවත් වූ සේවාවක් දැයට ඉටුකරනු ලබයි. ආනයන හා අපනයන නියාමනයෙන් මහජන සෞඛ්‍ය, ජාතික ආරක්ෂාව, පරිසර සුරක්ෂිතතාව හා ආර්ථික ස්ථායිතාව තහවුරු කිරීම මෙන්ම අන්තර්ජාතික වෙළඳාමට අවශ්‍ය පහසුකම් ද සම්පාදනය මෙම දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබයි.

2020 සහ 2021 කාලපරිච්ඡේදය තුළ කොවිඩ් -19 ගෝලීය වසංගත තත්ත්වය හමුවේ රටක් ලෙස විශාල අභියෝග රැසකට මුහුණ දීමට සිදුවිය. මෙම අනපේක්ෂිත තත්ත්වය තුළ 2021 වර්ෂයේ දී අප දෙපාර්තමේන්තුව අරමුණු සහ පරමාර්ථයන් වෙත ළඟා වීමට මා ඇතුළු මගේ කාර්යමණ්ඩලය මහත් පරිශ්‍රමයක් දරමින් සාර්ථකව බාධක මැඩගෙන වඩාත් කාර්යක්ෂම හා ඵලදායි සේවාවක් අප සේවාලාභීන්ට සැපයීමට හැකි වීම දෙපාර්තමේන්තුව ලද විශාල ජයග්‍රහණයකි. විශේෂයෙන් ම ආර්ථිකයේ ස්වාධිපත්‍ය හෙවත් ශ්‍රී ලංකා රුපියලට එරෙහි ඇමරිකානු ඩොලරය පාලනය සඳහා 2020 මාර්තු මස අගභාගයේ සිට අප දෙපාර්තමේන්තුවේ මැදිහත්වීම සාධනීය හා අවස්ථානුකූල වේ. ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ ඉතිහාසය තුළ වෙන කවරදාකටත් වඩා කැපී පෙනෙන කාර්යභාරයක් ඉටු කරමින් ශ්‍රී ලංකා රජයට ආර්ථිකයේ විදේශ විනිමය අනුපාතය මත වූ පීඩනය අවම කිරීමට අවශ්‍ය පූර්ණ සහයෝගය ලබා දීමට මෙම දෙපාර්තමේන්තුවට හැකිවිය.

1977 ඇති වූ විවෘත ආර්ථිකය සමග ශ්‍රී ලංකාව ආනයනය මත පදනම් වූ ආර්ථික රටාවක් කරා කෙමින් පරිවර්තනය විය. එහි අවසන් ප්‍රතිඵලය වුයේ වෙළඳ ගිණුමේ ශේෂය සෘණ අගයක් ගැනීම හා වෙළඳ ගිණුමේ ශේෂය පුළුල් වීමයි. මෙම පරතරය මූල්‍යනය කිරීම උදෙසා විශාල වශයෙන් වාර්ෂිකව විදේශයන්ගෙන් ණය ගැනීමට සිදුවේ. 2019 වර්ෂයේ බලයට පත්වූ වත්මන් ජනාධිපතිතුමාගේ "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති මාලාව අනුව අපනයන ආර්ථිකයක් ගොඩනැගීම ඉලක්ක කර ඇත. අපනයන ක්ෂේත්‍රය දිරිගැන්වීමේ අරමුණ පෙරදැරිව දේශීය ව්‍යවසායකයා නඟාසිටුවීම සඳහා උපායමාර්ගික සැලසුම් රජය විසින් දියත් කරන ලදී. ඒ අතර දේශීය කර්මාන්තකරුවන්ට තම නිෂ්පාදිතවලට වෙළඳපොළ ප්‍රවේශය පහසුව උදෙසා අවශ්‍ය ආනයන හා අපනයන රෙගුලාසි මෙම දෙපාර්තමේන්තුව විසින් පනවන ලදී. ඒ හරහා දේශීයව නිෂ්පාදනය කළ හැකි භාණ්ඩ නිෂ්පාදනයට ධෛර්යමත් කරන ලදී.

මහජන සෞඛ්‍යයට අහිතකර ලෙස බලපාන ඇතැම් ආහාර වර්ග සැකසීම සඳහා භාවිත කරන පාම් තෙල් සම්බන්ධයෙන් සහ මහජන සෞඛ්‍යය හා පාරිසරිය ආරක්ෂා කිරීමේ අරමුණ පෙරදැරිව දේශීය කෘෂි කර්මාන්තය නඟා සිටුවීම උදෙසා කාබනික පොහොර භාවිතය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින්

රසායනික පොහොර, කෘමිනාශක සහ වල්නාශක සම්බන්ධයෙන් ආනයන සීමා කිරීමට අදාළව පනවන ලද රෙගුලාසි සමාජය තුළ මහත්සේ කථාබහට ලක් විය.

අපගේ සේවාලාභීන් හට කාර්යක්ෂම හා ඵලදායි සේවාවක් සැපයීම ඉලක්ක කර අප දෙපාර්තමේන්තුවේ ව්‍යුහාත්මක වැඩිදියුණු කිරීම් කිහිපයක් සාර්ථක ලෙස සිදු කිරීමෙන් සේවාලාභීන්ගේ ප්‍රශංසාවට පාත්‍ර වීම පිළිබඳ මා නිහතමානීව සතුටට පත් වෙමි. එමෙන් ම වසංගත තත්ත්වය පාලනය උදෙසා සෞඛ්‍ය අංශ වෙතින් වරින් වර පල කරන ලද සෞඛ්‍ය මාර්ගෝපදේශ නීතිරීතිවලට අනුගතව සේවකයන්ගේ සෞඛ්‍ය තත්ත්වය යහමින් රැකෙන පරිදි දෙපාර්තමේන්තුව තුළ වැඩකිරීමට සෞඛ්‍ය ආරක්ෂිත වටපිටාවක් ගොඩනඟන ලදී.

ආනයන හා අපනයන පාලක ජනරාල් ලෙස මා නිරන්තරයෙන් දිරිමත් කරමින් නිහතමානීව අවශ්‍ය තැන්හි උපදෙස් හා මඟපෙන්වීම් ලබාදෙමින් නිරතුරු අධීක්ෂණය යටතේ මෙම දෙපාර්තමේන්තුව කාර්යක්ෂමව හා සඵලදායී ලෙස පවත්වාගෙන යාම සඳහා ගරු මුදල් අමාත්‍යතුමා මෙන්ම මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු එහි නිලධාරීන් පිරිස සහ අවසාන වශයෙන් මෙම දෙපාර්තමේන්තුවේ මාහට උපරිමයෙන් අවශ්‍ය සහයෝගය ලබාදෙමින් හා දිරිමත් කරන සෙසු කළමනාකාරිත්වය ඇතුළු සේවක මණ්ඩලයටද මාගේ හෘදයාංගම ස්තුතිය පුදකර සිටිමි.

**ටී.වී.ඩී. දමයන්ති එස්.කරුණාරත්න**
ආනයන හා අපනයන පාලක ජනරාල්

## පටුන

I පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය 01

1.1 හැඳින්වීම 01
1.2 දෙපාර්තමේන්තුවේ දැක්ම, මෙහෙවර සහ අරමුණු 02
1.3 දෙපාර්තමේන්තුවේ අරමුණු, වගකීම් හා කාර්යභාරය 03
1.4 සංවිධාන ව්‍යුහය හා සටහන 05

2 පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම 07

2.1 2021 වර්ෂය තුළ ප්‍රකාශයට පත්කරන ලද නව විධිවිධාන 07
2.2 ශ්‍රී ලංකාවේ ආනයන හා අපනයන නියාමන ප්‍රතිපත්තිය දියුණු කිරීම. 12
2.3 ආනයන හා අපනයන බලපත්‍ර නිකුත් කිරීම 17
2.4 පසුගිය වසර 5 තුළ නිකුත් කරන ලද බලපත්‍ර පිළිබඳ දත්ත සමාලෝචනය 25
2.5 ආනයන හා අපනයන ගෙවීම් ක්‍රම සහ නියෝග 27

3 පරිච්ඡේදය - වසරේ සමස්ථ මූල්‍ය කාර්යසාධන 29

3.1 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය 29
3.2 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය 30
3.3 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය 31
3.4 ආදායම් එකතු කිරීමේ කාර්යසාධන 32
3.5 2021 වර්ෂය සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය 33
3.6 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු
ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන 34
3.7 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය 34
3.8 විගණකාධිපතිවරයාගේ වාර්තාව 35

4 පරිච්ඡේදය - කාර්යසාධන දර්ශකය 46

4.1 ආයතනයේ කාර්යසාධන දර්ශකය (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව) 46

5 පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සාක්ෂාත් කරගැනීමේ කාර්යසාධනය 47

5.1 හඳුනා ගන්නා ලද තිරසාර සංවර්ධන අරමුණු 47
5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග 51

6 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ 52

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය 52
6.2 දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ
අතිරික්තයේ බලපෑම 52
6.3 මානව සම්පත් සංවර්ධනය 53

7 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව 55
සමාප්ති සටහන 63

# 1 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

## 1.1 හැඳින්වීම

1969 අංක 1 දරන ආනයන හා අපනයන පාලන පනත යටතේ පිහිටුවා ඇති ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව විසින් "සෞභාග්‍යයේ දැක්ම " යන වර්තමාන රාජ්‍ය ප්‍රතිපත්තියෙහි ඇතුළත් අරමුණු සාක්ෂාත් කරගැනීම උදෙසා ඉටුකර ඇති කාර්යභාරය අතිමහත්ය. ඈත ඉතිහාසයකට හිමිකම් කියන මෙම දෙපාර්තමේන්තුව, වර්තමානයේ දී ආනයන හා අපනයන නියාමනය පමණක් නොව ආනයන හා අපනයන වෙළෙඳාමට පහසුකම් සපයන ආයතනයක් ලෙස ද කටයුතු සම්පාදනය කරමින් සිටී.

එකී අරමුණු සාක්ෂාත් කරගැනීමේ දී රටේ ආරක්ෂාව, ආර්ථිකය, මහජන සෞඛ්‍ය සහ පරිසරය කෙරෙහි වැඩි අවධානයක් යොමුකරමින් දෙපාර්තමේන්තුවේ මෙහෙවර ප්‍රකාරව, ආනයන හා අපනයන නියාමනය සඳහා පාලනය කළ යුතු අයිතම හඳුනාගනිමින් රෙගුලාසි සකස් කිරීමටත් ජාත්‍යන්තර වෙළෙඳාමේදී ශ්‍රී ලාංකීය අභිමානය මෙන්ම පාරිභෝගික ආරක්ෂාව සුරක්ෂිත වන පරිදි ආනයනය කරන ලද භාණ්ඩ සඳහා ප්‍රමිතකරණය හඳුන්වා දීමටත් කටයුතු සිදුකරනු ලබයි.

2020 වර්ෂයේ සිට පැවති කොවිඩ් - 19 වසංගත තත්ත්වය මත ආර්ථිකය කෙරෙහි ඇති වූ බලපෑම ක්‍රමයෙන් අඩුවීමත් සමග අත්‍යවශ්‍ය ආනයනික භාණ්ඩ මත පනවා තිබූ යම් යම් සීමාකිරීම් ලිහිල් කිරීමටත් දේශීය නිෂ්පාදන කර්මාන්ත දිරිගැන්වීමේ අරමුණින් දේශීය වශයෙන් නිපදවනු ලබන යම් යම් භාණ්ඩ මත පනවා තිබූ ආනයන සීමාකිරීම් තවදුරටත් පවත්වාගෙන යාමටත් කටයුතු කරන ලදී.

මේ වන විට සේවාලාභීන්ට මාර්ගගත පද්ධතියක් භාවිතයෙන් අන්තර්ජාලය හරහා දෙපාර්තමේන්තුවේ සියලුම ඒකක වෙත අයදුම්පත් ඉදිරිපත්කර බලපත්‍ර ලබාගැනීම, නව ආනයනකරුවන් ලියාපදිංචි කිරීම හා විද්‍යුත් ක්‍රමවේද හරහා ගෙවීම් කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සම්පාදනය කර ඇත.

දෙපාර්තමේන්තුවට පැමිණෙන සේවාලාභීන්ට කාර්යක්ෂම හා ගුණාත්මක සේවාවක් ලබාදීමේ අරමුණින් දෙපාර්තමේන්තු කාර්යමණ්ඩලය දැඩි කැපවීමෙන් යුතුව කටයුතු කරනු ලබන අතර සේවා ලාභීන්ට අවශ්‍ය තොරතුරු සැපයීමේ දී අඩු කාලයක් තුළ වඩා නිරවද්‍ය තොරතුරු ලබාදීමේ අරමුණින් විමසුම් කවුළුවක් ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග දැනටමත් සිදුකරමින් පවතී.

## 1.2 දෙපාර්තමේන්තුවේ දැක්ම, මෙහෙවර සහ අරමුණු

### 1.2.1 ආයතනික දැක්ම

යහපත් අනාගතයක් උදෙසා

පරිසරය සහ මහජනතාව

සුරක්ෂිත කිරීම.

### 1.2.2 ආයතනික මෙහෙවර

රටේ ආරක්ෂාව, ආර්ථිකය, මහජන සෞඛ්‍යය, පරිසර සංරක්ෂණය ආදිය සැලකිල්ලට ගෙන, භාණ්ඩ ආනයන හා අපනයන පාලනය සම්බන්ධයෙන් රජය විසින් වරින්වර ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණ 1969 අංක 1 දරන ආනයන හා අපනයන පාලන පනත අනුව ක්‍රියාත්මක කිරීම.

### 1.2.3 අරමුණු

රටේ ආරක්ෂාව තහවුරු කිරීම, ආර්ථිකය නංවාලීම සහ මහජන සෞඛ්‍යය හා පරිසරය ආරක්ෂා කිරීම සඳහා රජය විසින් කලින් කලට ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණවලට අනුකූලව ආනයන හා අපනයන නියාමනය කිරීම.

## 1.3 දෙපාර්තමේන්තුවේ වගකීම් හා කාර්යභාරය

i. ආනයනය හා අපනයන පාලනයට අදාළ රෙගුලාසි ඇතුළත් ගැසට් නිවේදන ප්‍රකාශයට පත් කිරීම.

ii. ආනයන හා අපනයන පාලන රෙගුලාසි වලට යටත්ව මෙරට ආර්ථිකයේ යහපත උදෙසා බලපත්‍ර නිකුත් කිරීම.

iii. උපායමාර්ගික වෙළඳ කළමනාකරණ ක්‍රමයක් සහ ගෝලීය බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රමයක් ඇති කිරීම සම්බන්ධයෙන් අදාළ රාජ්‍ය ආයතන සමග සම්බන්ධීකරණ කටයුතු කිරීම.

iv. මොන්ට්‍රියල් සම්මුතියට අනුව ඕසෝන් වියනට හානි කරන වායූන් ආනයනය පාලනය කිරීම.

v. ශ්‍රී ලංකාවේ දේශීය සහ විදේශීය වෙළඳාම දියුණු කිරීම සඳහා වන ලෝක වෙළඳ සංගමයේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැපයීම.

vi. ආනයන හා අපනයන පාලනයට අදාළව මෙහෙයුම් මාර්ගෝපදේශ වාණිජ බැංකුවලට නිකුත් කිරීම.

vii. ජාත්‍යන්තර වාණිජමය ගනුදෙනුවලට අදාළ වන ගෙවීම් ක්‍රම ප්‍රකාශයට පත් කිරීම හා නියාමනය කිරීම.

viii. ආනයන හා අපනයන පාලන ප්‍රතිපත්තීන්ට අනුව, විදේශ විනිමය වැය නොවන පදනම මත කරනු ලබන ආනයන සඳහා අනුමැතීන් ලබාදීම.

ix. ආනයන හා අපනයන පාලන රෙගුලාසි සම්බන්ධයෙන් පැන නගින ගැටලු සහගත අවස්ථාවලදී රේගු අධ්‍යක්ෂ ජනරාල්ට සහ විනිමය පාලකට අවශ්‍ය සහාය ලබාදීම.

x. අදාළ රජයේ ගාස්තු එක්රැස් කර, ඒකාබද්ධ අරමුදලට බැර කිරීම.

### 1.3.1 දෙපාර්තමේන්තුවේ වත්මන් කාර්යයන්

i. ශ්‍රී ලාංකික පාරිභෝගිකයාට ප්‍රමිතියෙන් යුතු භාණ්ඩ භාවිත කිරීමට ඉඩ සැලසීම වෙනුවෙන් දැනට ප්‍රකාශයට පත්කර ඇති ආනයන හා අපනයන අතිවිශේෂ ගැසට් නිවේදනය (ප්‍රමිති හා තත්ත්ව පාලන) යාවත්කාලීන කිරීම.

ii. පූර්ව නැව්ගත කිරීමේ පරීක්ෂණ සහතික නිකුත් කරන බලයලත් පරීක්ෂකවරුන්ගේ සංඛ්‍යාව වැඩිකිරීම සහ එම පරීක්ෂණ සහතික නිකුත් කිරීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් වූ මාර්ගෝපදේශ සකස්කිරීම.

iii. ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ සේවය කරනු ලබන නිලධාරීන්ගේ හැකියාව, නිපුණතා සහ ඵලදායිතාව වර්ධනය සඳහා පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම සහ සේවක සුභසාධනය වෙනුවෙන් පියවර ගැනීම.

iv. දෙපාර්තමේන්තුවේ සේවාලාභීන්ට කඩිනම් සේවාවක් සැපයීම වෙනුවෙන් නිතර යාවත්කාලීන වන මාර්ගගත බලපත්‍ර පද්ධතියක් (Online Licensing System) ස්ථාපිත කිරීම.

## 1.4 සංවිධාන ව්‍යුහය හා සටහන

මෙම දෙපාර්තමේන්තුව වර්තමානයේ දී මුදල් අමාත්‍යාංශය යටතේ ගැසට් කරන ලද ආයතනයක් වන අතර ආනයන හා අපනයන පාලක ජනරාල් එහි ප්‍රධානියා වේ. ආනයන හා අපනයන පාලන පනත යටතේ පාලක ජනරාල්ගේ මූලිකත්වයෙන් යටතේ තීන්දු තීරණ ක්‍රියාත්මක වීම සඳහා නිලධාරි මණ්ඩලයක් අනුයුක්තව සිටින අතර එහි පරිපාලන ව්‍යුහය පහත සඳහන් අංශයන්ගෙන් සමන්විත වේ.

I. ආයතන අංශය
II. ගිණුම් අංශය
III. පර්යේෂණ හා ප්‍රතිපත්ති අංශය
IV. අභ්‍යන්තර විගණන අංශය
V. බලපත්‍ර නිකුත් කිරීමේ අංශ
   - ඒකක 1 - ඖෂධ හා ශෛල්‍ය උපකරණ
   - ඒකක 2 - පාවිච්චි කරන ලද මෝටර් රථ සහ වාහන අමතර කොටස්
   - ඒකක 3 - රසායනික ද්‍රව්‍ය, පොහොර, පලිබෝධනාශක හා කාර්මික අමුද්‍රව්‍ය
   - ඒකක 4 - ජංගම දුරකථන හා සන්නිවේදන උපකරණ
   - ඒකක 5 - වෙනත් ආනයන සහ අපනයන

VII. තොරතුරු තාක්ෂණ අංශය

දෙපාර්තමේන්තුවට පැමිණෙන සේවාලාභීන්ට උසස් තත්ත්වයේ සේවාවක් සැපයීම වෙනුවෙන් සහ දෙපාර්තමේන්තුවේ වැඩ කටයුතු කාර්යක්ෂම හා ඵලදායී අයුරින් සිදුකරගෙන යාමට ඉවහල් වනු පිණිස ඉහත අංශයන් විසින් විවිධ රාජකාරීන් 2021 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලදී.

# සංවිධාන සටහන (Organizational Chart)



# 2. පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

## 2.1 2021 වර්ෂය තුළ ප්‍රකාශයට පත්කරන ලද නව විධිවිධාන

කොවිඩ් - 19 වසංගත ව්‍යාප්තිය හමුවේ ජාතික ආර්ථිකය ශක්තිමත් කිරීම හා පුනර්ජීවනය උදෙසා 2021 වර්ෂයේ දී අභියෝග රසකට මුහුණ පෑමට සිදු විය. එම අභියෝග ජයගැනීම සඳහා රජය විසින් ගන්නා ලද ප්‍රතිපත්තිමය තීරණ ක්‍රියාත්මක කරමින් මෙම දෙපාර්තමේන්තුව විසින් සුවිශේෂී කාර්යභාරයක් ඉටුකරන ලදී.

කොවිඩ් - 19 වසංගත ව්‍යාප්තිය හමුවේ විදේශ විනිමය රට තුළට ගලා ඒමේ ප්‍රවනතාවයේ ශීඝ්‍ර අඩුවීමක් සිදු විය. ඒ අනුව, විදේශ මුදලට සාපේක්ෂව දේශීය මුදලේ අගය (රුපියල) අවප්‍රමාණය විය. එබැවින්, විනිමය අනුපාතිකය සහ මුලා වෙළඳපොළට සිදුවන පීඩනය අවම කිරීමේ අරමුණින් රජය විසින් ගනු ලැබූ තීරණ අතර අත්‍යවශ්‍ය භාණ්ඩ පමණක් ආනයනය සඳහා ඉඩ ලබා දීම සුවිශේෂී වේ. තවද, රජයේ ප්‍රතිපත්ති අනුව යමින් ජාතික ආර්ථිකය ශක්තිමත් කිරීම හා පුනර්ජීවනය උදෙසා විනිමය අනුපාතිකය ස්ථාවර කිරීමේ අරමුණින් අතිගරු ජනාධිපතිතුමා විසින් පත්කරන ලද තීරුබදු නිර්ණය කිරීමේ කමිටුවේ නිර්දේශය මත ඇතැම් අයිතම සඳහා පැවති සීමා ලිහිල් කිරීමත්, සංවර්ධන ව්‍යාපෘති අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා ආයෝජන මණ්ඩලය විසින් අනුමත කළ ව්‍යාපෘති සඳහා අවශ්‍ය භාණ්ඩ ආනයනයට අවස්ථාව ලබා දීමත් සිදු විය.

'සෞභාග්‍යයේ දැක්ම' ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව, ශ්‍රී ලාංකීය කෘෂිකර්මාන්තයේ අභිවෘද්ධිය වෙනුවෙන් වස විසෙන් තොර හරිත කෘෂි ආර්ථිකයක් ගොඩනැගීමට අදාළව රසායනික පොහොර, පළිබෝධ නාශක සහ කෘමි නාශක ආනයනය නියාමනය කරමින් රෙගුලාසි පනවන ලදී.

මීට අමතරව හඳුනාගත් අයිතම ආනයන පාලනයට යටත් කරන ලද අතර පාරිභෝගික අවශ්‍යතාව කෙරෙහි වැඩි අවධානයක් යොමු කරමින් ආනයන පාලනයට යටත්ව තිබූ අයිතම ආනයන පාලනයෙන් ඉවත්කර ආනයන කටයුතු සුමටව පවත්වාගෙන යාමට අවස්ථාව ලබා දෙන ලදී.

### 2.1.1 ප්‍රකාශයට පත්කරන ලද ගැසට් නිවේදන

| අනු අංකය | අතිවිශේෂ ගැසට් නිවේදන අංකය | දිනය | විස්තරය |
|---|---|---|---|
| 1. | 2209/18 | 2021.01.05 | දේශීයව නිෂ්පාදනය කරනු ලබන හඳුනාගත් ටයර් ප්‍රමාණ කිහිපයක් ආනයනය තාවකාලිකව අත්හිටුවීම. |
| 2. | 2214/56 | 2021.02.11 | සෙරමික් නානකාමර උපාංග සහ නල, ණය පදනම මත ආනයනයට අවසර දීම. |
| 3. | 2222/31 | 2021.04.06 | පාම් තෙල් ආනයනය තහනම් කිරීම. |
| 4. | 2224/43 | 2021.04.23 | ජංගම වැඩපළ රථ ආනයනය නියාමනය කිරීම. |
| 5. | 2224/44 | | |
| 6. | 2226/48 | 2021.05.06 | රසායනික පොහොර, කෘමිනාශක සහ වල්නාශක ආනයනය තහනම් කිරීම. |

| | | | |
|---|---|---|---|
| 7. | 2231/16 | 2021.06.11 | රතුන් සහ මුහුණු ආවරණ ආනයන බලපත්‍ර පාලනයට යටත් කිරීම. |
| 8. | 2231/17 | 2021.06.11 | ඔක්සිජන් සහ ශ්වසන ආධාරක උපකරණ අපනයනය අත්හිටුවීම. |
| 9. | 2231/18 | 2021.06.11 | හඳුනාගත් භාණ්ඩ ආනයනය තාවකාලිකව අත්හිටුවීම |
| 10. | 2238/45 | 2021.07.31 | ස්වාභාවික ඛනිජ, කිලේටඩ් සහ අංශු මාත්‍ර ශාක පෝෂක ආනයන බලපත්‍ර පාලනයට යටත් කිරීම. |
| 11. | 2247/12 | 2021.09.29 | සුදු සීනි මත පනවා තිබූ ආනයන පාලන බලපත්‍ර අවශ්‍යතාව ඉවත් කිරීම. |
| 12. | 2249/10 | 2021.10.11 | මගී සහ භාණ්ඩ ආනයනය සඳහා යොදාගන්නා හෝ ඒ හා සමාන යාත්‍රා සඳහා බලපත්‍ර ගාස්තු. |
| 13. | 2252/30 | 2021.11.03 | සහල් මත පැවති තාවකාලික ආනයන තහනම ඉවත් කිරීම. |
| 14. | 2256/23 | 2021.11.30 | රසායනික පොහොර, කෘමිනාශක හා වල්නාශක ආනයන තහනම ඉවත් කිරීම, මග සොයගැනීමේ උපකරණ ආනයන පාලනයට යටත් කිරීම හා ග්ලයිෆොසෙට් ආනයනය තහනම් කිරීම. |

**අති විශේෂ ගැසට් නිවේදන අංක 2209/18 – 2021.01.05 - දේශීයව නිෂ්පාදනය කරනු ලබන හඳුනාගත් ටයර් ප්‍රමාණ කිහිපයක් ආනයනය තාවකාලිකව අත්හිටුවීම.**

දේශීය නිෂ්පාදන නගා සිටුවීම සඳහා සහ කොවිඩ්-19 අනපේක්ෂිත බලපෑම් හමුවේ විදේශ වෙළඳපොළට සහ මුල්‍යා අනුපාතිකයට සිදුවූ පීඩනය අවම කිරීම සඳහා දේශීයව නිෂ්පාදනය කරනු ලබන ටයර් ප්‍රමාණ කිහිපයක් ආනයනය තාවකාලිකව අත්හිටුවන ලදී.

**අති විශේෂ ගැසට් නිවේදන අංක 2214/56 - 2021.02.11 - සෙරමික් නානකාමර උපාංග සහ නල, ණය පදනම මත ආනයනයට අවසර දීම.**

දේශීයව නිෂ්පාදනය කරනු ලබන සෙරමික් නානකාමර උපාංග සහ නල දේශීය අවශ්‍යතාව සපුරාලීම සඳහා ප්‍රමාණවත් නොවූ බැවින් එතෙක් ආනයනය තාවකාලිකව තහනම් කර තිබූ එම භාණ්ඩ, සැපයුම්කරුගෙන් ලබා ගන්නා දින 180ක ණය පදනම මත ආනයනයට අවසර ලබා දෙන ලදී. තවද, දේශීය පිගන් මැටි අත්කම් සඳහා වෙළඳපොළක් නිර්මාණය කිරීම වෙනුවෙන් පිඟන් මැටි අත්කම් ආනයනය තාවකාලිකව අත්හිටුවන ලදී.

**අති විශේෂ ගැසට් නිවේදන අංක 2222/31 - 2021.04.06 - පාම් තෙල් ආනයනය තහනම් කිරීම.**

අතිගරු ජනාධිපතිතුමන්ගේ “සෞභාග්‍යයේ දැක්ම” අනුව දේශීය පොල් වගාව දියුණු කිරීම සඳහා කටු පොල් වගාව සහ පාම් තෙල් ආනයනය තහනම් කිරීම සඳහා අවශ්‍ය පියවර ගන්නා ලදී. තවද ශුද්ධ නොකළ පාම් තෙල් භාවිතයෙන් සැකසූ ආහාර පරිභෝජනය මහජන සෞඛ්‍යයට අහිතකර ලෙස බලපාන බව වෛද්‍ය ක්ෂේත්‍රයේ ප්‍රවීණයන්, ආහාරවේදීන් මෙන්ම ලෝක සෞඛ්‍ය සංවිධානයේ වාර්තා මඟින් පෙන්වා දී තිබීම මෙම තහනම් ක්‍රියාත්මක කිරීමට තවත් හේතුවක් විය.

නමුත්, සම්මත ප්‍රමිතීන්ට අනුකූල වන පාම් තෙල් වර්ග ආහාර සැකසුම් කර්මාන්තයේ භාවිතවන අතර ආහාර සැකසුම් කර්මාන්තයට අවශ්‍ය එවැනි සම්මත ප්‍රමිතීන්ට අනුකූල පිරිපහදු කළ

විරන්ජනීකෘත සහ සුගන්දහරණය කළ පාම් තෙල් සහ කර්මාන්ත සඳහා අවශ්‍ය වන ශුද්ධ නොකළ පාම් තෙල්, පාම් ස්ටයරින් ආනයනය බලපත්‍ර පාලනයට යටත් කරන ලදී.

**අති විශේෂ ගැසට් නිවේදන අංක 2224/43 සහ 2224/44 - 2021.04.23 - ජංගම වැඩපළ රථ ආනයනය නියාමනය කිරීම.**

ද්විත්ව කාර්යය වාහන ආනයනය සඳහා අයකරන තීරුබදු ප්‍රමාණයට වඩා අඩු ප්‍රමාණයක් ජංගම වැඩපොළ රථ සඳහා අය කෙරුණු බැවින්, ආනයනය කරනු ලබන ජංගම වැඩපොළ රථ, ද්විත්ව කාර්යය රථ ලෙස ලියාපදිංචි කිරීමෙන් යම් විශේෂ වාසියක් ආනයනකරුවන්ට අත්වන බැව් නිරීක්ෂණය විය. ඒ අනුව, රාජ්‍ය ගිණුම් කාරක සභාවේ නිර්දේශයන් ද සැලකිල්ලට ගෙන ද්විත්ව කාර්යය රථ හා ජංගම වැඩපොළ රථ සඳහා සමාන තීරුබදු ප්‍රමාණයක් අයකිරීමට සහ සමාන ආයුකාලයක් මත පදනම්ව ආනයනයට ඉඩදීම සඳහා ජංගම වැඩපොළ රථ ආනයනයට නව සංයෝජිත වර්ගීකරණ සංකේතාංක ප්‍රසිද්ධ කරන ලදී.

රටේ පවතින කොවිඩ්-19 වසංගත තත්ත්වය තුළ ජාතික ආර්ථිකය සුරක්ෂිත කිරීම උදෙසා ජංගම වැඩපොළ රථ ද ආනයන හා අපනයන රෙගුලාසි මඟින් ආනයනය අත්හිටුවා තිබූ බැවින් ප්‍රසිද්ධියට පත්කරන ලද නව සංයෝජිත වර්ගීකරණ සංකේතාංක ද එකතු කරමින් එම රෙගුලාසි සංශෝධනය කිරීම සිදුකරන ලදී.

ආයුකාලය වසර තුනකට අඩු ජංගම වැඩපොළ රථ ආනයනය තාවකාලිකව අත්අත්හිටුවීම සඳහා අංක 2224/44 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය ද ආයුකාලය වසර තුනකට වැඩි ජංගම වැඩපොළ රථ ආනයන බලපත්‍ර පාලනයට යටත් කර එය දැනට ආනයන බලපත්‍ර නිකුත් නොකරන භාණ්ඩයට ඇතුළත් කිරීම සඳහා අංක 2224/43 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය ද ප්‍රකාශයට පත් කරන ලදී.

**අති විශේෂ ගැසට් නිවේදන අංක 2226/48 - 2021.05.06 - රසායනික පොහොර, කෘමිනාශක සහ වල්නාශක ආනයනය තහනම් කිරීම.**

අතිගරු ජනාධිපතිතුමා විසින් කෘෂි නිෂ්පාදන සඳහා කාබනික පොහොර භාවිතය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් රසායනික පොහොර, කෘමිනාශක සහ වල්නාශක ආනයනය තහනම් කිරීම සඳහා ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය 2021 අප්‍රේල් මස 27 වැනි දින අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී. ඒ අනුව,රසායනික පොහොර, කෘමිනාශක සහ වල්නාශක ආනයනය සඳහා භාවිත කරන තෝරාගත් සංයෝජිත වර්ගීකරණ සංකේතාංක, ආනයනය තහනම් භාණ්ඩ ලැයිස්තුවට එක් කරන ලදී. තවද එම අමාත්‍ය මණ්ඩල තීරණයට පටහැනි නොවන පරිදි, දේශීය කර්මාන්ත සඳහා අවශ්‍ය රසායනික ද්‍රව්‍ය ලබා දීමේ අරමුණින් හඳුනාගත් සංයෝජිත වර්ගීකරණ සංකේතාංක, බලපත්‍ර පාලනයට යටත් කරන ලදී. ඒ හැරුන විට ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිසමේ ඉල්ලීමක් මත මග සොයාගැනීමේ උපකරණ (Navigational Apparatus) ආනයන බලපත්‍ර පාලනයට යටත් කරන ලදී.

**අති විශේෂ ගැසට් නිවේදන අංක 2231/16 - 2021.06.11 - රත්‍රන් සහ මුහුණු ආවරණ ආනයන බලපත්‍ර පාලනයට යටත් කිරීම.**

විදේශ විනිමය විශාල වශයෙන් රටින් ඉවතට ගලා යන ප්‍රභවයක් ලෙස රත්‍රන් ආනයනය හඳුනාගන්නා ලදී. එලෙස පාලනයකින් තොරව විදේශ විනිමය රටින් ඉවතට යාම විදේශ විනිමය අනුපාතිකයට සහ මූල්‍ය වෙළඳපොළට අනපේක්ෂිත බලපෑමක් ඇතිකරන බැවින් රත්‍රන් ආනයනය මෙලෙස නියාමනය කරන ලදී. තවද, ආනයන බලපත්‍ර පාලනයට යටත් කර තිබූ මුහුණු ආවරණ

සඳහා නව සංයෝජිත වර්ගීකරණ කේත හඳුන්වා දුන් බැවින් එම කේතද බලපත්‍ර පාලනයට යටත් කිරීමට මෙම ගැසට් පත්‍රය ප්‍රකාශයට පත් කරන ලදී.

**අති විශේෂ ගැසට් නිවේදන අංක 2231/17 - 2021.06.11- ඔක්සිජන් සහ ශ්වසන ආධාරක උපකරණ අපනයන අත්හිටුවීම.**

ලොවපුරා පැතිරගිය කොවිඩ්-19 වසංගතය සමග ඔක්සිජන් සහ ශ්වසන ආධාරක සඳහා ඉල්ලුම වැඩි වූ බැවින් දේශීය ඔක්සිජන් සැපයුම සුරක්ෂිත කිරීම සඳහා ඔකසිජන් අපනයනය නියාමනය කරන ලදි. ඒ අනුව, ජාතික ඖෂධ නියාමන අධිකාරියේ නිර්දේශය මත පමණක් ඔක්සිජන් සහ ශ්වසන ආධාරක අපනයනය කළ හැකිය.

**අති විශේෂ ගැසට් නිවේදන අංක 2231/18 - 2021.06.11 - හඳුනාගත් භාණ්ඩ ආනයනය තාවකාලිකව අත්හිටුවීම.**

කොවිඩ්-19 වසංගතය හමුවේ ඇතිවූ අනපේක්ෂිත ආර්ථික තත්ත්වය හේතුවෙන් විදේශ සංචිත හා මූල්‍ය වෙළඳපොළ මත ඇතිවූ පීඩනය අවම කිරීම සඳහා භාණ්ඩ ආනයනය විධිමත් කිරීමට, 2020 අප්‍රේල් මාසයේ සිට පියවර ගන්නා ලදී. කෙසේවෙතත් දේශීය කර්මාන්තවලට හා පාරිභෝජනයට අඛණ්ඩව පහසුකම් සැලසීම සඳහා භාණ්ඩ ආනයන සීමා කිරීමට යොදාගත් ක්‍රියාමාර්ග සමාලෝචනය කිරීම, කොන්දේසි ලිහිල් කිරීම, ඉවත් කිරීම ඇතුළුව එම ක්‍රියාමාර්ග සංශෝධනය කිරීම සඳහා අවශ්‍ය පියවර ගන්නා ලදී. ඒ අනුව, සැපයුම්කරුවන්ගේ ණය පහසුකම මත ආනයනය කිරීමට ඉඩ දී තිබූ භාණ්ඩ ලැයිස්තුව ඉවත් කිරීම සහ එම භාණ්ඩ සාමාන්‍ය පරිදි ආනයනය කිරීමට ඉඩදීම සහ තෝරාගත් කෘෂි නිෂ්පාදන, ප්ලාස්ටික් භාණ්ඩ, සෙරමික් භාණ්ඩ, වාහන සහ දැවමය නිෂ්පාදන ආනයනය සීමා කිරීම් දිගටම පවත්වාගෙන යාම වෙනුවෙන් ඉහත සඳහන් ගැසට් පත්‍රය ප්‍රකාශයට පත් කරන ලදී.

**අති විශේෂ ගැසට් නිවේදන අංක 2238/45 - 2021.07.31- ස්වාභාවික ඛනිජ, කිලේටඩ් සහ අංශු මාත්‍ර ශාඛ පෝෂක ආනයන බලපත්‍ර පාලනයට යටත් කිරීම.**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කරන ලද රසායනික පොහොර, කෘමිනාශක හා වල්නාශක ආනයනය තහනම් කිරීම සඳහා වූ යෝජනාවට අමාත්‍ය මණ්ඩලය විසින් ලබා දුන් තීරණය ප්‍රකාරව අංක 2226/48 සහ 2021.05.06 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් එම භාණ්ඩ ආනයනය තහනම් කරන ලදී. නමුත් මෙම තහනම් ක්‍රියාත්මක කිරීමේදී පැන නැගුනු ගැටළු හේතුවෙන් සහ ශාකවල වර්ධනය සඳහා අවශ්‍ය ශාක පෝෂක ලබා දීම සඳහාත් එනම් ස්වාභාවික ඛනිජ, කිලේටඩ් සහ අංශු මාත්‍ර ශාඛ පෝෂක ආනයනට ඉඩ දීම සඳහා 2021 ජූලි මස 31 දිනැති අංක 2238/45 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයෙන් එම රෙගුලාසි සංශෝධනය කරන ලදී.

**අති විශේෂ ගැසට් නිවේදන අංක 2247/12 - 2021.09.29 - සුදු සීනි මත පනවා තිබූ ආනයන පාලන බලපත්‍ර අවශ්‍යතාව ඉවත් කිරීම.**

අතිගරු ජනාධිපතිතුමා විසින් ඉදිරිපත් කළ, ජීවන වියදම ස්ථාවරව පවත්වාගැනීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්තිමය සහ ප්‍රයෝගික විසඳුම් ලබා දීම සඳහා අමාත්‍ය මණ්ඩල යෝජනාවට ලද තීරණය ප්‍රකාරව ජීවන වියදම් පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාව පත් කරන ලදී. අනතුරුව, සීනි ඇතුළු අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය සැපයීමේ හිඟතාව මත මිල ඉහළ යෑමේ ප්‍රවනතාවක් පවතින බව එම අනුකාරක සභාව විසින් පෙන්වා දෙන ලදී. ඒ අනුව, ආනයනකරුවන්ට ආනයනය කර හිඟයකින් තොරව වෙළඳපොළවෙත සීනි ලබා දීම සඳහා සීනි ආනයනය මත පනවා තිබූ ආනයන බලපත්‍ර අවශ්‍යතාව ඉවත් කිරීමට එම අනුකමිටුව තීරණය කරන ලදී. එම තීරණය ක්‍රියාත්මක කිරීමට සුදු සීනි මත පනවා තිබූ ආනයන පාලන බලපත්‍ර අවශ්‍යතාව ඉවත් කිරීම සඳහා ඉහත අතිවිශේෂ ගැසට්

පත්‍රය ප්‍රකාශයට පත් කරන ලදී. තවද, දේශීය දුඹුරු සීනි නිෂ්පාදනයට පහසුකම් සැලසීමේ අදහසින් දුඹුරු සීනි ආනයනය තවදුරටත් ආනයන පාලන බලපත්‍ර ක්‍රමයේ තබා ගැනීමට කටයුතු කර ඇත.

**අති විශේෂ ගැසට් නිවේදන අංක 2249/10 - 2021.10.11 - මගී සහ භාණ්ඩ ආනයනය සඳහා යොදාගන්නා හෝ ඒ හා සමාන යාත්‍රා සඳහා බලපත්‍ර ගාස්තු.**

2020.12.14 දිනැති අංක 2206/5 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් පාවිච්චි කරන ලද මගී සහ භාණ්ඩ ආනයනය සඳහා යොදාගන්නා හෝ ඒ හා සමාන බෝට්ටු හා යාත්‍රා සඳහා ආනයන බලපත්‍ර පාලනයට යටත් කරන ලදී. එබැවින්, එම යාත්‍රා සඳහා ආනයන පාලන බලපත්‍ර නිකුත් කිරීම වෙනුවෙන් අය කළ යුතු බලපත්‍ර ගාස්තුව ප්‍රකාශයට පත් කිරීම සඳහා 2021 ඔක්තෝබර් 11 දිනැති අංක 2249/10 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය ප්‍රකාශයට පත් කරන ලදී.

**අති විශේෂ ගැසට් නිවේදන අංක 2252/30 – 2021.11.03 - සහල් මත පැවති තාවකාලික ආනයන තහනම ඉවත් කිරීම.**

දේශීය සහල් අවශ්‍යතාව සපුරාලීම සඳහාත් වෙළෙඳපොළ තුළ පවතින සහල් හිඟය මඟහරවා ජනතාවට අවශ්‍ය සහල් හිඟයකින් තොරව පහසු මිලට ලබාදීම සඳහාත් අවශ්‍ය පහසුකම් සැපයීමට රජයේ අවධානය යොමු විය. ඒ අනුව, සහල් (සම්බා, නාඩු සහ කැකුළු) මත පැවති තාවකාලික ආනයන තහනම ඉවත් කරන ලදී.

**අති විශේෂ ගැසට් නිවේදන අංක 2256/23 - 2021.11.30 - රසායනික පොහොර, කෘමිනාශක හා වල්නාශක ආනයන තහනම ඉවත් කිරීම, මග සොයගැනීමේ උපකරණ ආනයන පාලනයට යටත් කිරීම හා ග්ලයිෆොසෙට් ආනයනය තහනම් කිරීම.**

අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 21/0746/301/013 සහ 2021.04.27 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව රසායනික පොහොර, කෘමිනාශක හා වල්නාශක ආනයනය තහනම් කිරීම සඳහා 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත ප්‍රකාරව ආනයනය පාලන රෙගුලාසි අංක 2226/48 සහ 2021.05.06 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයෙහි ප්‍රකාශයට පත් කරන ලද අතර ස්වාභාවික ඛනිජ, කිලේටඩ් සහ අංශු මාත්‍ර ශාඛ පෝෂක ආනයනට ඉඩ දීම සඳහා 2021 ජුලි මස 31 දිනැති අංක 2238/45 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයෙන් එම රෙගුලාසි සංශෝධනය කරන ලදී. අනතුරුව, 2021.11.29 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අංක 2226/48 සහ 2021.05.06 දිනැති අතිවිශේෂ ගැසට් නිවේදනය වහාම ක්‍රියාත්මක වන පරිදි අවලංගු කිරීමට අමාත්‍ය මණ්ඩලය තීරණය කරන ලද අතර එම තීරණය මෙම අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් ක්‍රියාත්මක කරන ලදී.

තවද, ග්ලයිෆොසේට් මානව සෞඛ්‍යයට අහිතකර බැවින් ග්ලයිෆොසේට් ආනයනය තහනම් කිරීමට සහ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ඉල්ලීම පරිදි නාවුක මඟ පෙන්වීමේ ආධාරක උපකරණ ආනයන බලපත්‍ර පාලනයට යටත් කරන ලදී.

### 2.1.2 මෙහෙයුම් උපදෙස් හා අභ්‍යන්තර චක්‍රලේඛ නිකුත් කිරීම.

දෙපාර්තමේන්තුව විසින් වර්ෂය තුළ ප්‍රකාශිත ගැසට් නිවේදනයන්හි ඇතුළත් රෙගුලාසි පිළිබඳව ශ්‍රී ලංකා රේගුව, සියලුම වාණිජ බැංකු හා දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ දැනුම්වත්භාවය ඉතා වැදගත් වේ.

ගැසට්පත්‍රයක් ප්‍රකාශයට පත්කරන සැමවිටම ඊට අදාළව මෙහෙයුම් උපදෙස් නිකුත් කිරීම හා අභ්‍යන්තර චක්‍රලේඛයක් නිකුත් කිරීම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන වගකීමකි. ඒ අනුව, 2021

වර්ෂය තුළ දෙපාර්තමේන්තුව විසින් මෙහෙයුම් උපදෙස් 28 ක් හා අභ්‍යන්තර චක්‍රලේඛ 15 ක් නිකුත් කිරීමට පියවර ගෙන ඇත.

## 2.2 ශ්‍රී ලංකාවේ ආනයන හා අපනයන නියාමන ප්‍රතිපත්තිය දියුණු කිරීම.

ශ්‍රී ලංකාවේ ආනයන හා අපනයන ප්‍රතිපත්ති නියාමනය කිරීමේ හා එම ප්‍රතිපත්ති වැඩිදියුණු කිරීමේ ප්‍රධානතම ආයතනය ලෙස ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව විසින් 2021 වර්ෂය තුළ දී සිදුකරන ලද කාර්යභාරය පහත පරිදි වේ.

### 2.2.1 ආනයන (ප්‍රමිතකරණ හා තත්ත්ව පාලන) නියෝග

උසස් ප්‍රමිතියකින් හා ඉහළ ගුණාත්මකභාවයකින් යුක්ත ආනයනික භාණ්ඩ භාවිත කිරීමට රටේ පාරිභෝගිකයින්ට අවස්ථාව ලබා දීම සඳහා ආනයනික භාණ්ඩ ශ්‍රී ලංකා ප්‍රමිතීන්ට අනුකූල වීම අනිවාර්ය කරමින් හා යාවත්කාලීන කරමින් ආනයන (ප්‍රමිතකරණ හා තත්ත්ව පාලන) ගැසට් නිවේදන කලින්කලට නිකුත් කරනු ලැබේ. ඒ අනුව, දැනට ක්‍රියාත්මකව පවතින 2018 මාර්තු මස 29 දිනැති අංක 2064/34 දරන ආනයන (ප්‍රමිතකරණ හා තත්ත්ව පාලන) අතිවිශේෂ ගැසට් නිවේදනය සංශෝධනය කිරීමේ අවශ්‍යතාව දෙපාර්තමේන්තුව විසින් හඳුනාගනිමින් ඒ සඳහා අදාළ ක්‍රියාමාර්ග මේ වන විටත් ගෙන ඇත.

එලෙස ප්‍රමිතකරණ හා තත්ත්ව පාලයන්ට අනුකූල විය යුතු ආනයනික අයිතම කිහිපයක් හඳුනාගෙන හා අදාළ පාර්ශ්වයන්ගේ අදහස් හා යෝජනා ලබා ගෙන ඇත. ඒ අනුව, ඉදිරිපත් වී ඇති සියලු යෝජනා ගැසට් නිවේදනයේ ඇතුළත් කිරීම සඳහා ඇති හැකියාව පිළිබඳව අදාළ රාජ්‍ය ආයතන, වාණිජ මණ්ඩල හා වාණිජ බැංකු සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව ගැසට් නිවේදනය කෙටුම්පත් කිරීමේ කටයුතු මේ වන විට අවසන් කර ඇති අතර, ඉදිරියේදී එය ප්‍රකාශයට පත්කිරීමට කටයුතු සැලසුම් කර ඇත.

තවද, ද්‍රව පෙට්‍රෝලියම් ගෑස් (LP Gas) ආශ්‍රිත අනතුරු ගණනාවක් සිදුව ඇති බව මෙම වර්ෂයේ අග භාගයේ දිවයිනේ බොහෝ ප්‍රදේශවලින් වාර්තා වූ හෙයින් ගෘහ අවශ්‍යතා සඳහා ද්‍රව පෙට්‍රෝලියම් ගෑස් භාවිතය පිළිබඳ විශ්වාසය ද අඩු වී ඇත. ද්‍රව පෙට්‍රෝලියම් ගෑස් සහ එහි අනුශාංගික උපාංග තත්ත්ව/ප්‍රමිතීන්ට අනුකූල වීම සඳහා නිසි ලෙස නියාමනය කිරීමේ කාලීන අවශ්‍යතායක් මතු වී ඇත. එමනිසා, ප්‍රමිතියෙන් අඩු ද්‍රව පෙට්‍රෝලියම් ගෑස් සහ එහි අනුශාංගික උපාංග ආනයනය කිරීම සම්බන්ධයෙන් ප්‍රමිති පරීක්ෂා කිරීමේ ක්‍රමවේදයක් සැකසීමට ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය ඇතුළුව අදාළ පාර්ශවයන්ගේ සහභාගීත්වයෙන් මේ වන විට මෙම දෙපාර්තමේන්තුවේ පූර්ණ මැදිහත් වීමෙන් අවශ්‍ය කටයුතු කඩිනමින් සිදු කරමින් පවතී.

### 2.2.2 එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ 1540 දරන යෝජනාව ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීම.

එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ යෝජනා 1540 ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපත්තිමය අනුමැතිය 2019 සැප්තැම්බර් මස 11 දින අමාත්‍ය මණ්ඩලය විසින් ලබා දෙන ලදී. එම අනුමැතිය අනුව, මෙම 1540 දරන යෝජනා වඩා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා නීති සම්පාදන කමිටුව සහ තාක්ෂණ කමිටුව වශයෙන් රාජ්‍ය ආයතනවලින් සැදුම්ලත් කමිටු ද්විත්වයක් අමාත්‍ය මණ්ඩල අනුමැතිය හරහා පත් කර ඇත.

එම නීති සම්පාදන කමිටුව මඟින් අංක 1540 දරණ යෝජනාව ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය නීති කෙටුම්පත් කරන අතර මේ වන විට උපායමාර්ගික වෙළඳ කළමනාකරණ පනත

කෙටුම්පත් කර ඇති අතර එය කමිටුවේ සිටින විශේෂඥ දැනුමක් ඇති අය සමග සාකච්ඡා කරමින් පවතී.

ජාතික උපායමාර්ගික අපනයන පාලන ලැයිස්තුව සකස් කිරීම සඳහා තාක්ෂණික කමිටුව විසින් යුරෝපීය සංගම් ද්විභාවිත භාණ්ඩ ලැයිස්තුව සහ යුරෝපීය සංගම් යුධඅවි ලැයිස්තුව සිංහල හා දමිළ මාධ්‍යයට පරිවර්තනය කළ අතර එය එම කමිටුව විසින් අධ්‍යයනය කරමින් පවතී. 2022 වර්ෂයේ දී එය අවසන් කිරීමට නියමිතව ඇත.

### 2.2.3 පූර්ව නැව්ගත කිරීමේ පරීක්ෂණ සහතිකය (Pre-Shipment Inspection Certificate)

පාවිච්චි කළ වාහන ශ්‍රී ලංකාවට ආනයනය කිරීමේ දී වාහන නියමිත වායු විමෝචන ප්‍රමිතීන් සහ ආරක්ෂක මිනුම් ප්‍රමිතිවලට අනුකූල ද යන්න පරීක්ෂා කිරීම සඳහා පරීක්ෂණයකට ඉදිරිපත් කළ යුතු බැවින් ඒ සඳහා පූර්ව අපනයන පරීක්ෂණ සහතිකය ලබාගත යුතු බලයලත් පරීක්ෂණ ආයතන ඇතුළත් කර 2013 අප්‍රේල් මස 04 දිනැති අංක 1804/17 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය ප්‍රකාශයට පත්කර ඇත.

එම ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කර ඇති පරීක්ෂණ ආයතන මඟින් පමණක් පූර්ව අපනයන පරීක්ෂණ සහතිකය ලබාගත යුතු වීම මත ඒකරාශී වී ඇති ඒකාධිකාරය හේතුවෙන් සේවා සැපයීමේ දී ඇතිවන දුෂ්කරතාවයන් සැලකිල්ලට ගෙන තම සේවාලාභීන් වෙත වඩා කාර්යක්ෂම හා ගුණාත්මක සේවාවක් ලබාදීමේ අරමුණින් බලයලත් පරීක්ෂණ ආයතන සංඛ්‍යාව වැඩිකිරීමේ අවශ්‍යතාවයක් ඇති විය. ඒ අනුව, තාක්ෂණික ඇගයුම් කමිටුවක් හරහා එම කාර්යය සිදුකිරීමට දෙපාර්තමේන්තුව විසින් අවශ්‍ය කටයුතු සිදුකර ඇත.

මේවන විට බලයලත් පරීක්ෂණ ආයතන සංඛ්‍යාව වැඩි කිරීම සඳහා අවශ්‍ය ගැසට් නිවේදනය කෙටුම්පත් කර ඇති අතර බලයලත් පරීක්ෂණ ආයතන කිහිපයක් සම්බන්ධයෙන් තවදුරටත් ශ්‍රී ලංකා ප්‍රතිතන මණ්ඩලය සමග සම්බන්ධීකරණ කටයුතු සිදුකෙරෙමින් පවතී.

ඒ අනුව, මෙම ගැසට් නිවේදනය ප්‍රකාශයට පත්කිරීම තුළින් ඉදිරියේදී ආනයනකරුවන්ට වාහන ආනයනයේ දී මුහුණ පෑමට සිදුවන දුෂ්කරතා අවම කරගැනීමට හා ඒවා මිලදී ගන්නා පාරිභෝගිකයන්ගේ ආරක්ෂාව තහවුරු කර ගැනීමටත් ඉඩකඩ සැලසෙනු ඇති බව සඳහන් කළ හැකිය.

### 2.2.4 ආනයන හා අපනයන වෙළෙඳාම සඳහා පහසුකම් සැපයීම.

#### 2.2.4.1 පුරවැසි ප්‍රඥප්තිය (Citizen's Charter)

ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව යටතේ පවත්වාගෙන යනු ලබන සේවාවන් හා වගකීම් සම්බන්ධයෙන් අදාළ සේවාලාභීන් දැනුම්වත් කිරීම වඩා වැදගත් වේ. රටේ සාමාන්‍ය ජනතාවට අදාළ රාජ්‍ය ආයතනය තුළින් ලබාගත හැකි සේවාවන් පිළිබඳවත් එම ආයතනය සම්බන්ධ සියලු තොරතුරු ගොනුකරමින් මෙම මාර්ගෝපදේශය පිළියෙළ කරනු ලබයි. ඒ හරහා ජනතාවට මෙම දෙපාර්තමේන්තුවෙන් යම් සේවාවක් ලබා ගැනීමේදී ක්‍රියාකළ යුතු ආකාරය හා ඉදිරිපත් කළ යුතු ලියවිලි සම්බන්ධව පැහැදිලි අවබෝධයක් ලැබීමෙන් ඵලදායි සේවාවක් ලබා ගැනීමේ පහසුව සැලසේ. ඒ අනුව, ආයතනයේ පුරවැසි ප්‍රඥප්තිය යාවත්කාලීන කිරීමට කටයුතු කරන ලදී.

### 2.2.4.2 අසාධුගත ලේඛනය (Blacklist)

රටේ ආරක්ෂාව, මහජන සෞඛ්‍යය හා සුරක්ෂිත පරිසරයක් තහවුරු කිරීම සඳහා ආනයන හා අපනයන පාලන රෙගුලාසි මඟින් නියම කර ඇති ප්‍රමිතීන්ට අනුකූල නොවන ලෙස භාණ්ඩ අනයනය කරන ආනයනකරුවන්ගේ ලේඛනයක් ප්‍රසිද්ධියට පත් කිරීමට ආනයන හා අපනයන පාලන පනතේ විධිවිධාන සලසා ඇත. ඒ අනුව, එවැනි ආනයනකරුවන් ප්‍රසිද්ධියට පත් කිරීමේ ක්‍රමවේදය ඇතුළත් රෙගුලාසි ත්‍රෛභාෂාවෙන් කෙටුම්පත් කර නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත. එම දෙපාර්තමේන්තුවෙන් ලබා ගන්නා නිර්දේශ මත 2022 වර්ෂයේදී එහි ඉදිරි කටයුතු සිදු කිරීමට බලාපොරොත්තු වේ.

### 2.2.4.3 මාර්ගෝපදේශ සංග්‍රහය යාවත්කාලීන කිරීම (Updating the Guideline)

දෙපාර්තමේන්තුව මඟින් ඉටුකරනු ලබන කාර්යයන් වඩාත් ඵලදායීව හා කාර්යක්ෂමව සිදුකිරීමට මාර්ගෝපදේශ සංග්‍රහය ඉවහල් වේ. විශේෂයෙන්ම දෙපාර්තමේන්තුවේ සේවයට අනුයුක්ත කරනු ලබන නවක නිලධාරින් හට මෙවැනි මාර්ගෝපදේශ සංග්‍රහයකින් රාජකාරී ඉටුකිරීමට අදාළවන දැනුම ලබාගත හැකි වේ.

එබැවින් මීට වසර ගණනාවකට පෙර සකස් කර ප්‍රකාශයට පත්කර ඇති මාර්ගෝපදේශ සංග්‍රහය වර්තමානයේ දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත්කර ඇති ගැසට් නිවේදන මඟින් පනවා ඇති නීති රෙගුලාසි හා නිකුත් කර ඇති මෙහෙයුම් උපදෙස් හා අභ්‍යන්තර චක්‍රලේඛ පදනම් කරගෙන කාලීන අවශ්‍යතාවයන් වලට අනුව යාවත්කාලීන කිරීම සිදුකළ යුතු බව හඳුනාගන්නා ලදී.

ඒ අනුව, අදාළ සංශෝධන සිදුකිරීම සඳහා පත්කරන ලද කමිටුව විසින් මාර්ගෝපදේශ සංග්‍රහය නැවත සමාලෝචනය කරන ලද අතර එම කමිටුවේ යෝජනාවලට අනුව එයට සංශෝධනයන් එක් කරන ලදී. තව ද මේ වන විට ඒකක මඟින් ආනයන පාලන බලපත්‍ර නිකුත් කිරීම මාර්ගගත ක්‍රමය හරහා සිදුකිරීම ආරම්භ කර ඇති බැවින් ඊට අනුරූප වන ලෙස මාර්ගෝපදේශ සංග්‍රහයේ අඩංගු ඒකකයන්හි කාර්යයන් හා ක්‍රියා පිළිවෙත නැවත සංශෝධනය කරන ලදී.

එමෙන්ම ප්‍රතිපත්ති අංශය මඟින් සිදුකරනු ලබන කාර්යයන් සම්බන්ධයෙන් දීර්ඝ ලෙස සාකච්ඡා කිරීම සඳහා 2021 වර්ෂයේදී රැස්වීම් වාර කිහිපයක් පැවැත්වීමට සිදු වූ අතර එහිදී දෙපාර්තමේන්තුවේ සේවය කරන අත්දැකීම් බහුල නිලධාරීන්ගෙන් ඉදිරිපත් වූ විවිධ අදහස් පිළිබඳව දීර්ඝ වශයෙන් සාකච්ඡා කිරීම සඳහා වැඩි කාලයක් කැප කිරීමට ද සිදුවිය. එහි ප්‍රතිඵලයක් ලෙස ප්‍රතිපත්ති අංශය මඟින් ඉටුකරනු ලබන පහත දක්වා ඇති කාර්යයන් ඉටුකරනු ලබන ක්‍රියා පිළිවෙත වඩා නිවැරදි ලෙස නැවත සකස් කරන ලදී

- විදේශ විනිමය වැය නොවන පදනම මත භාණ්ඩ ආනයනය කිරීම.
- වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කිරීම.
- විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම.
- දෙපාර්තමේන්තුවට එරෙහිව ආනයනකරුවන් විසින් ගොනු කරනු ලබන නීති කෘත්‍යයන් සම්බන්ධව කටයුතු කිරීම.

මීට අමතරව ගිණුම් හා පාලන අංශ මඟින් ඉටුකරනු ලබන කාර්යයන් සම්බන්ධයෙන් තවදුරටත් සාකච්ඡාකර එම අංශවල කාර්යභාරයන් ද නැවත සංශෝධනයන්ට ලක්කිරීමට

කටයුතු කර ඇති අතර 2022 වර්ෂයේදි දෙපාර්තමේන්තුවේ සියලුම නිලධාරීන්ගේ පරිහරණය සඳහා මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාශයට පත්කිරීමට නියමිතව ඇත.

**2.2.4.4 ආනයන හා අපනයන අනුමැතීන් ලබාදීමේදී නිර්දේශ ලබාදිය යුතු ආයතන හඳුනා ගැනීම (Recommending Authorities)**

බලපත්‍ර පාලනයට යටත් කරන ලද භාණ්ඩයක් සඳහා බලපත්‍රයක් ලබාගැනීමට දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුත්තේ කුමන ආයතනයක නිර්දේශයක් ද යන්න පිළිබඳව දෙපාර්තමේන්තු නිලධාරින් මෙන්ම, සේවාලාභීන් ද දැනුම්වත් වීම අත්‍යාවශ්‍ය වේ.

ඒ අනුව, දෙපාර්තමේන්තු කාර්යයන් වඩාත් විධිමත්ව හා කාර්යක්ෂමව පවත්වාගෙන යාම සඳහා අයිතමයන් හඳුන්වනු ලබන සංයෝජිත වර්ගීකරණ සංකේතාංකයන්ට අදාළව නිර්දේශ ලබාදිය යුතු ආයතන කවරේද යන්න ඇතුළත් ලැයිස්තුවක් සකස් කිරීමේ අවශ්‍යතාව හඳුනාගන්නා ලදී.

ඒ අනුව, වඩා නිවැරදි මගපෙන්වීමක් ලබාදීමේ අරමුණින් දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය හා අවශ්‍ය අවස්ථාවලදී ව්‍යාපාර ආයතනවල ද සහාය ඇතිව සකස් කර ඇති ආනයන හෝ අපනයන පාලනයට යටත් රේගු සංයෝජිත වර්ගීකරණ යටතේ ගැනෙන එක් එක් අයිතම සඳහා නිගමනය කරන ලද නිර්දේශිත ආයතන ලැයිස්තු ගත කර ප්‍රකාශයට පත්කිරීමට නියමිතය.

**2.2.4.5 ඒකාබද්ධ සංයෝජිත වර්ගීකරණය සංකේතාංක මාර්ගෝපදේශය (Consolidated H.S. Guide)**

දෙපාර්තමේන්තුව විසින් හඳුනාගත් අයිතම ආනයන සීමා කිරීම උදෙසා වරින් වර ගැසට් නිවේදන ප්‍රකාශයට පත් කරනු ලබයි. එලෙස ප්‍රකාශයට පත්කර ඇති ගැසට් නිවේදනවල ආනයන බලපත්‍ර පාලනයට යටත් කර ඇති අයිතම (ICL), ආනයනය තාවකාලිකව තහනම් කර ඇති අයිතම (TS), ආනයනය බලපත්‍ර පාලනයට යටත් වුව ද බලපත්‍ර නිකුත් කිරීම අත්හිටුවා ඇති අයිතම (SL) හා ආනයනය තහනම් කර ඇති අයිතම (B) දක්වා ඇත. විටෙක ආනයනය කරන අයිතම පිළිබඳව පවතින සීමාවන් හඳුනාගැනීමට ගැසට් නිවේදන කිහිපයක් පරිශීලනය කිරීමට සිදුවේ. එම ප්‍රයෝගික ගැටලුව හඳුනාගත් මෙම දෙපාර්තමේන්තුව තම සේවාලාභීන්ට මුහුණ දීමට සිදුවන දුෂ්කරතා මඟ හැරවීමේ අරමුණින් එලෙස මේ දක්වා ප්‍රකාශයට පත්කර ඇති සියලු ගැසට් නිවේදනවල අඩංගු සීමා කරන ලද අයිතම හා ඊට අදාළ සංයෝජිත වර්ගීකරණ සංකේතාංකයන් ඒකාබද්ධ කරමින් සංයෝජිත වර්ගීකරණ සංකේතාංක මාර්ගෝපදේශයක් පිළියෙල කරන ලදී. එමඟින් දෙපාර්තමේන්තු සේවාලාභීන්ට මෙන්ම දෙපාර්තමේන්තුවේ සේවය කරන නිලධාරින්ට ඉතා කෙටිකාලයක් තුළ තමන්ට අවශ්‍ය විස්තර ලබා ගැනීමටත් ශ්‍රී ලංකා රේගුව හා සියලුම වාණිජ බැංකු වෙත පහසුකම් සැපයීමේ දී තම කාර්යයන් වඩා පහසුවෙන් හා කාර්යක්ෂමතාවයෙන් යුක්තව ඉටුකිරීමටත් මෙමඟින් ඉඩකඩ සැලසී ඇත.

**2.2.4.6 නව අයදුම්පත් ආකෘතීන් හඳුන්වා දීම.**

සේවාලාභීන්ට ප්‍රතිපත්ති අංශය මඟින් වඩා කාර්යක්ෂමව හා නිරවද්‍යතාවයෙන් යුතුව තම සේවාවන් ඉටුකරගැනීම පහසු කිරීමේ අරමුණින් අනුමැතීන් ලබා ගැනීම සඳහා ඉදිරිපත්

කරනු ලබන අයදුම්පත්වලට අදාළව පහත දක්වා ඇති නව ආකෘතීන් හඳුන්වා දී ඇති අතර එම ආකෘතීන් දෙපාර්තමේන්තු වෙබ් අඩවිය ඔස්සේ බාගත කරගැනීම සඳහා අවශ්‍ය පහසුකම් දැනටමත් සම්පාදනය කර ඇත.

P1 - නියමිත කාලසීමාව ඉකුත්වීමෙන් පසු පිළිගැනීම මත ලේඛන/ විවෘත ගිණුම් මත ගෙවීම්

P2 - විදේශ විනිමය වැය නොවන පදනම මත සිදුකරනු ලබන ආනයන

P3 - පෙර ගෙවීම්

P4 - විද්‍යුත් ප්‍රේෂණ සහ ණයවර ලිපි මත ගෙවීම්

P5 - ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි කර්මාන්තවලින් , පාලනයට ලක්වූ අයිතම නිදහස් කිරීම

P6 - ප්‍රති අපනයනය

P7 - වාහන ආනයනයේ දී සිදුවන අනනුකූලතාවයන්

**2.2.4.7 සේවාවන් මාර්ගගත ක්‍රමයට ක්‍රියාත්මක කිරීම.**

රටතුළ පැවති කොවිඩ් -19 තත්ත්වය තුළ පැවති සංචරණ සීමා හේතුවෙන් සේවාලාභීන්ට තම සේවාවන් ලබාගැනීම සඳහා දෙපාර්තමේන්තුව වෙත පැමිණීමේ දී යම් යම් දුෂ්කරතාවන්ට මුහුණ පෑමට සිදුවිය. එවැනි පසුබිමක් තුළ අන්තර්ජාලය භාවිත කර මාර්ගගත ක්‍රමය ඔස්සේ අයදුම්පත් ඉදිරිපත් කිරීමට හා ඊට අදාළ ගෙවීම් සිදුකිරීමටත් නව ආනයනකරුවන් ලියාපදිංචි කිරීමටත් අවස්ථාව උදාකර දීමට හැකිවීම දෙපාර්තමේන්තුව ලද විශාල ජයග්‍රහණයක් විය.

තව ද මේ දක්වා ජාතික වෙළඳ පහසුකම් සැපයීමේ කමිටුව (NTFC) මඟින් ද පෙන්වා දුන් ආකාරයට රේගු දෙපාර්තමේන්තුවේ මෘදුකාංග පද්ධතිය (ASYCUDA) සමග සම්බන්ධ වී රේගු සටහන්කරයෙහි නිරවද්‍යතාවය සෘජුවම තහවුරු කිරීමට හැකි වීම තුළින් ආනයනකරුවන් විසින් බලපත්‍ර හර කිරීම සඳහා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන ලියකියවිලිවල ඇති විය හැකි විෂමතාවන් වළක්වා ගැනීමට ද හැකි වී ඇත. මේ මඟින් ව්‍යාජ ලියවිලි ඉදිරිපත් වීම වළකා රේගු බදු වංචා අවම කිරීමට හැකි වීම වැදගත් සංදිස්ථානයකි.

## 2.3 ආනයන හා අපනයන බලපත්‍ර නිකුත් කිරීම

ආනයන හා අපනයන කටයුතු නියාමනය කරනු ලබන ආයතනයක් ලෙස මෙම දෙපාර්තමේන්තුව ආනයන හා අපනයන පාලන බලපත්‍රයට යටත් කරන ලද අයිතම සඳහා බලපත්‍ර නිකුත් කිරීම මෙයින් සිදු කෙරෙන ප්‍රධාන කාර්යය වේ. ඒ අනුව, එකී කාර්යය විධිමත්ව හා ඵලදායිව සිදු කරමින් සේවාලාභීන් වෙත ගුණාත්මක සේවාවක් ලබා දීමට මෙම දෙපාර්තමේන්තුවේ ස්ථාපිත කර ඇති ඒකක 5ක් යටතේ බලපත්‍ර නිකුත් කිරීම සිදු කරනු ලබයි.

### 2.3.1 ඒකක 01- ඖෂධ හා ශෛල්‍ය උපකරණ

මෙම ඒකකය මඟින් ඖෂධ හා ශෛල්‍ය උපකරණ වර්ග කාණ්ඩ 5ක් යටතේ වර්ගීකරණය කර බලපත්‍ර නිකුත් කිරීමේ කටයුතු සිදුකරන අතර, 2021 වර්ෂයේදී එක් එක් කාණ්ඩය යටතේ නිකුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව පහත පරිදි වේ.

| අංකය | විස්තරය | කාණ්ඩය | බලපත්‍ර සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | බටහිර ඖෂධ | 400 | 1,602 |
| 2 | පශු ඖෂධ | 410 | 355 |
| 3 | ආයුර්වේද ඖෂධ | 420 | 220 |
| 4 | හෝමියෝපති ඖෂධ | 430 | 18 |
| 5 | ශල්‍ය මැහුම් තන්තු | 450 | 60 |
| **එකතුව** | | | **2,255** |

මෙහිදී ඖෂධවල ජීව කාලය සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් විශේෂ අවධානයක් යොමු කරන අතර, ඖෂධ සඳහා අවම ජීව කාලයක් පැවතීම අනිවාර්යය වේ. එසේ නොමැති ඖෂධ සම්බන්ධයෙන් නිර්දේශ ලබාගත යුතු ආයතන පිළිබඳව ද පැහැදිලිව හඳුන්වා දීමට කටයුතු කර ඇත.

**ඖෂධ හා ශෛල්‍ය උපකරණ සඳහා නිකුත් කළ බලපත්‍ර සංඛ්‍යාව**




## 2.3.2 ඒකක 2 - පාවිච්චි කරන ලද මෝටර් රථ සහ වාහන අමතර කොටස්

මෙම ඒකකය මඟින් පාවිච්චි කරන ලද මෝටර් රථ සහ වාහන අමතර කොටස් සඳහා බලපත්‍ර නිකුත් කිරීමේ කටයුතු සිදුකරනු ලබන අතර 2021 වර්ෂයට අදාළව පහත පරිදි බලපත්‍ර නිකුත් කර ඇත.

| | විස්තරය | කාණ්ඩය | බලපත්‍ර සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | විදේශ විනිමය උපද්දවන්නන් විසින් සිදු කරනු ලබන ආනයන | 100 | 0 |
| 2 | විදේශගත ශ්‍රමිකයන් විසින් සිදුකරන පරිත්‍යාග | 110 | 0 |
| 3 | විදේශිකයන් විසින් ආනයන කරනු ලබන වාහන | 120 | 0 |
| 4 | තානාපති කාර්යාල විසින් ආනයන කරනු ලබන වාහන | 130 | 1 |
| 5 | විශේෂ අවශ්‍යතා ඇති පුද්ගලයන් සඳහා ආනයන කරනු ලබන වාහන | 140 | 0 |
| 6 | සමාජ සේවා ආයතන සඳහා පරිත්‍යාග | 150 | 2 |
| 7 | නේවාසික විදේශිකයින් | 160 | 0 |
| 8 | පූජනීය ස්ථාන වෙනුවෙන් සිදුකරන ආනයන | 170 | 0 |
| 9 | විශේෂ කාර්ය යන්ත්‍ර සූත්‍ර | 180 | 1 |
| 10 | මෝටර් ට්‍රේලර් (පාවිච්චි කළ) | 185 | 0 |
| 11 | අපනයන ප්‍රවර්ධනය සඳහා තාවකාලික ආනයන කිරීම් | 190 | 0 |
| 12 | අවමංගල රථ | 200 | 0 |

| | | | |
|---|---|---|---|
| 13 | ගුවන් යානා සහ හෙලිකොප්ටර් අමතර කොටස් | 210 | 154 |
| 14 | එන්ජින් | 220 | 7 |
| 15 | යාත්‍රා සහ උපාංග | 225 | 4 |
| 16 | බොඩි ෂෙල් | 230 | 60 |
| 17 | කැබින් | 235 | 0 |
| 18 | පාවිච්චි කළ මෝටර් බයිසිකල් | 240 | 6 |
| 19 | හෙල්මට් | 245 | 21 |
| 20 | විවිධ | 250 | 1 |
| 21 | රේගු වෙන්දේසි | 255 | 0 |
| 22 | විදේශ දූත සේවාවන් හි නිලධාරීන් විසින් සිදුකරන ආනයන | 260 | 1 |
| 23 | බර වාහන | 270 | 3 |
| 24 | බර වාහන (ණයවර ලිපි බලපත්‍ර) | 275 | 0 |
| 25 | වාහන අමතර කොටස් | 280 | 1 |
| 26 | ටයර් | 285 | 0 |
| 27 | වැසි | 290 | 21 |
| 28 | ස්වයංක්‍රීය ත්‍රිරෝද රථ | 305 | 0 |
| 29 | ආසන (පාවිච්චි කළ වාහන ආසන) | 320 | 1 |
| 30 | ආනයන පරීක්ෂණ කොන්දේසි සමග අනුකූල නොවන ආනයන | 321 | 0 |
| **එකතුව** | | | **284** |

**පාවිච්චි කරන ලද මෝටර් රථ සහ වාහන අමතර කොටස් සඳහා නිකුත් කළ බලපත්‍ර සංඛ්‍යාව**



### 2.3.3 ඒකක 3 - රසායනික ද්‍රව්‍ය, පොහොර, පලිබෝධනාශක හා කාර්මික අමුද්‍රව්‍ය

ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද රසායනික ද්‍රව්‍ය, පොහොර, පලිබෝධනාශක හා කාර්මික අමුද්‍රව්‍ය සඳහා නිකුත් කරන ලද බලපත්‍ර පිළිබඳ විස්තර පහත පරිදි වේ.

| | විස්තරය | කාණ්ඩය | බලපත්‍ර සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | රසායනික ද්‍රව්‍ය හා කෘමිනාශක | 500 | 512 |
| 2 | ලුණු | 505 | 26 |
| 3 | ඛනිජ තෙල් නිෂ්පාදන | 510 | 1,284 |
| 4 | සීනි | 515 | 407 |
| 5 | කෘෂි රසායනික හැර අනෙකුත් රසායනික ද්‍රව්‍ය | 520 | 1,521 |
| 6 | රසායනික පොහොර | 525 | 131 |
| 7 | විකිරණශීලී ද්‍රව්‍ය | 530 | 208 |
| 8 | මද්‍යසාර | 540 | 224 |
| එකතුව | | | **4,313** |

**රසායනික ද්‍රව්‍ය, පොහොර, පලිබෝධනාශක හා කාර්මික අමුද්‍රව්‍ය සඳහා නිකුත් කළ බලපත්‍ර**



### 2.3.4 ඒකක 4 - ජංගම දුරකථන හා සන්නිවේදන උපකරණ

2021 වර්ෂයේදී ජංගම දුරකථන හා සන්නිවේදන උපකරණ සඳහා පහත පරිදි ආනයන බලපත්‍ර නිකුත් කර ඇත.

| | විස්තරය | කාණ්ඩය | බලපත්‍ර සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | ජංගම දුරකථන (පාවිච්චි කළ / අලුත්) | 615 | 6,918 |
| 2 | සන්නිවේදන උපකරණ | 620 | 1,456 |
| 3 | පරිගණක | 625 | 6 |
| 4 | පාවිච්චි කළ වායුසමීකරණ, පාවිච්චි කළ ශීතකරණ සහ අධි ශීතකරණ | 630 | 3 |
| 5 | තාප පොම්ප | 631 | 6 |
| 6 | පාවිච්චි කළ රෙදි සෝදන යන්ත්‍ර | 635 | 0 |
| 7 | ඉවත දමන ශීතකරණ වායු සිලින්ඩර | 640 | 77 |
| 8 | අලුත් ඉලෙක්ට්‍රොනික අයිතම | 645 | 157 |
| 9 | විදුලි ජේනු සහ කෙවෙනි | 655 | 67 |
| 10 | දුරස්ථ පාලකයකින් ක්‍රියා කරන සෙල්ලම් බඩු | 660 | 131 |
| 11 | මුද්‍රණ යන්ත්‍ර සහ ඡායා පිටපත් යන්ත්‍ර | 690 | 161 |
| 12 | කාලගුණ බැලූන | 695 | 0 |
| **එකතුව** | | | **8,982** |

**ජංගම දුරකථන හා සන්නිවේදන උපකරණ සඳහා නිකුත් කළ බලපත්‍ර**



### 2.3.5 ඒකක 5- වෙනත් ආනයන සහ අපනයන

වෙනත් ආනයන හා අපනයන සඳහා පහත පරිදි බලපත්‍ර නිකුත් කර ඇත.

| | විස්තරය | කාණ්ඩය | බලපත්‍ර සංඛ්‍යාව |
|---|---|---|---|
| ආනයන පාලන බලපත්‍ර | | | |
| 1 | සතුන් සහ සත්ත්ව නිෂ්පාදන | 550 | 1,837 |
| 2 | ශීත කළ මසුන් | 555 | 210 |
| 3 | ශීතකළ දැල්ලන් | 556 | 31 |
| 4 | ධාන්‍ය වර්ග | 570 | 77 |
| 5 | ශක්තිජනක පාන | 575 | 114 |
| 6 | තේ | 580 | 471 |
| 7 | පුපුරන ද්‍රව්‍ය හා ගිනි අවි | 600 | 91 |
| 8 | කාසි | 610 | 3 |
| 9 | ක්‍රීඩා භාණ්ඩ | 650 | 0 |
| 10 | දුම්වැටි කොළ | 670 | 41 |
| 11 | පාවිච්චි කළ ලී බඩු | 680 | 4 |
| 12 | කියත් | 685 | 49 |
| 13 | දැවි තෙල් | 700 | 256 |
| 14 | ලෝහ කැබලි , සුන්බුන් සහ වෙනත් | 715 | 200 |
| 15 | පාවිච්චි කළ ඇඳුම් | 720 | 0 |
| 16 | ප්ලාස්ටික් ආහාර බඳුන් | 730 | 0 |
| 17 | කාබනික අපද්‍රව්‍ය | 735 | 48 |
| 18 | පාම් තෙල් | 750 | 96 |
| 19 | රත්‍රං | 760 | 25 |
| | | | |
| අපනයන පාලන බලපත්‍ර | | | |
| 19 | ඉරන ලද දැව කොටස් | 602 | 7 |
| 20 | අබලි ලෝහ සුන්බුන් | 710 | 182 |
| එකතුව | | | **3,742** |

**වෙනත් ආනයන සහ අපනයන සඳහා නිකුත් කළ බලපත්‍ර**




## 2.3.6 2021 වර්ෂයේ නිකුත් කරන ලද ආනයන හා අපනයන පාලන බලපත්‍ර -මාසිකව

| මාසය | ඖෂධ | වාහන | රසායනික ද්‍රව්‍ය | සන්නිවේදන උපකරණ | වෙනත් ආනයන හා අපනයන | එකතුව |
|---|---|---|---|---|---|---|
| ජනවාරි | 220 | 12 | 419 | 746 | 296 | 1,693 |
| පෙබරවාරි | 194 | 24 | 468 | 915 | 360 | 1,961 |
| මාර්තු | 224 | 15 | 535 | 1,062 | 395 | 2,231 |
| අප්‍රේල් | 148 | 27 | 362 | 686 | 330 | 1,553 |
| මැයි | 162 | 20 | 286 | 924 | 298 | 1,690 |
| ජූනි | 223 | 26 | 303 | 704 | 413 | 1,669 |
| ජූලි | 173 | 40 | 320 | 831 | 314 | 1,678 |
| අගෝස්තු | 143 | 30 | 252 | 702 | 210 | 1,337 |
| සැප්තැම්බර් | 171 | 20 | 313 | 467 | 237 | 1,208 |
| ඔක්තෝබර් | 175 | 25 | 328 | 698 | 255 | 1,481 |
| නොවැම්බර් | 153 | 18 | 363 | 621 | 243 | 1,398 |
| දෙසැම්බර් | 269 | 27 | 364 | 626 | 391 | 1,677 |
| එකතුව | 2,255 | 284 | 4,313 | 8,982 | 3,742 | 19,576 |

### 2021 වර්ෂයේ නිකුත් කරන ලද බලපත්‍ර - මාසිකව




2021 වර්ෂයේ දී එක් එක් ඒකක මඟින් මාසිකව නිකුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව විශ්ලේෂණය කිරීමේ දී අනෙකුත් ඒකක මඟින් නිකුත් කර ඇති බලපත්‍රවලට සාපේක්ෂව ඒකක 4 මඟින් සන්නිවේදන උපකරණ ආනයනය සඳහා නිකුත්කර ඇති බලපත්‍ර සංඛ්‍යාව ශීඝ්‍ර ලෙස වැඩි වී ඇත. කොවිඩ් - 19 ගෝලීය වසංගත තත්ත්වය මත පනවන ලද සංවරණ සීමා හේතුවෙන් මහජන කාර්යයන් මෙන්ම පාසැල් අධ්‍යයන කටයුතු ද මාර්ගගත ක්‍රමය ඔස්සේ ඉටුකර ගැනීමට සිදුවිය. ඒ අනුව, විද්‍යුත් සන්නිවේදන උපකරණ සඳහා පැවති අධික ඉල්ලුම එකී බලපත්‍ර සංඛ්‍යාවේ ශීඝ්‍ර වැඩිවීමට හේතු විය. තව ද රජයේ ප්‍රතිපත්තිමය තීරණයක් මත වාහන ආනයනය සඳහා පනවා ඇති තාවකාලික තහනම හේතුවෙන් ප්‍රස්තාරයේ වාහන සහ අමතර කොටස් ආනයනට නිකුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව අවම මට්ටමක පවතින බව නිරීක්ෂණය වේ.

### 2.3.7 පසුගිය වසර 5 තුළ නිකුත් කරන ලද ආනයන හා අපනයන පාලන බලපත්‍ර සංඛ්‍යාව

පසුගිය වසර 5 තුළ එක් එක් ඒකකය මඟින් නිකුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව පහත පරිදි වේ.

| අයිතමය | 2017 | 2018 | 2019 | 2020 | 2021 |
|---|---|---|---|---|---|
| ඖෂධ | 2,205 | 2,293 | 2,489 | 2,594 | 2,255 |
| වාහන | 690 | 740 | 518 | 197 | 284 |
| රසායනික ද්‍රව්‍ය | 3,644 | 3,718 | 3,948 | 3,956 | 4,313 |
| සන්නිවේදන උපකරණ | 3,401 | 4,310 | 5,241 | 5,083 | 8,982 |
| වෙනත් ආනයන සහ අපනයන | 4,947 | 4,714 | 4,888 | 4,299 | 3,742 |
| **එකතුව** | **14,887** | **15,775** | **17,084** | **16,129** | **19,576** |

**පසුගිය වසර 5 තුළ නිකුත් කරන ලද ආනයන හා අපනයන පාලන බලපත්‍ර සංඛ්‍යාව**




## 2.4 පසුගිය වසර 5 තුළ නිකුත් කරන ලද ආනයන හා අපනයන පාලන බලපත්‍ර පිළිබඳ දත්ත සමාලෝචනය

### 2.4.1 ඖෂධ හා ශෛල්‍ය උපකරණ - ඒකක 1

2021 වසරේ ඒකක 1 මඟින් බටහිර ඖෂධ හා ආයුර්වේද ඖෂධ සඳහා නිකුත් කරනු ලැබූ බලපත්‍ර සංඛ්‍යාව 2020 වසරට සාපේක්ෂව අඩුවීමක් දක්නට ලැබේ. කොවිඩ් -19 වසංගත ව්‍යාප්තිය

හේතුවෙන් සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රමවේදයන්ට අනුගතව මුඛ ආවරණ පැලඳීම අනිවාර්ය කිරීම මත 2020 වර්ෂයේ දී ඒ සඳහා පැවති අධික ඉල්ලුම හේතුවෙන් එකී අයිතමය වැඩියෙන් ආනයනය කිරීමට සිදුවිය. එහෙත් දේශීයව මුඛ ආවරණ නිෂ්පාදනය ඉහළ යාමත් සමග මුඛ ආවරණ ආනයනය පහළ යාමෙන් 2021 වසරේ බටහිර ඖෂධ කාණ්ඩයේ නිකුත් කරනු ලැබූ බලපත්‍ර සංඛ්‍යාව අඩුවීමට හේතුවී ඇත. පසුගිය වසර 5 ක කාලය තුළ නිකුත් කරන බලපත්‍රවලට අදාළ දත්ත විශ්ලේෂණය කර බැලීමේ දී අඩුම බලපත්‍ර සංඛ්‍යාවක් නිකුත් කරන ලද වර්ෂය ලෙස 2021 වර්ෂය හැඳින්විය හැකිය.

### 2.4.2 පාවිච්චි කරන ලද මෝටර් රථ සහ වාහන අමතර කොටස් - ඒකක 2

කොවිඩ් -19 ගෝලීය වසංගත තත්ත්වය හමුවේ විනිමය අනුපාතය මත වූ පීඩනය අවම කිරීම උදෙසා සහ දේශීය කර්මාන්ත නංවාලීම සඳහා වාහන හා අමතර කොටස් ආනයන තාවකාලිකව අත්හිටුවීමට දෙපාර්තමේන්තුව විසින් රෙගුලාසි ප්‍රකාශයට පත්කිරීම හේතුවෙන් 2020 වර්ෂයේදී මෙම ඒකකය මඟින් නිකුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාවෙහි විශාල අඩුවීමක් දක්නට ඇත. එනමුත් දේශීයව වාහන එකලස් කිරීමේ කර්මාන්ත නඟා සිටුවීම උදෙසා අමුද්‍රව්‍ය ආනයනය කිරීමට බලපත්‍ර ලබා දීම 2021 වසරේ දී සිදු කරන ලද අතර ඒ හේතුවෙන් 2020 වර්ෂයට සාපේක්ෂව 2021 වර්ෂයේ දී බලපත්‍ර වැඩිපුර ප්‍රමාණයක් නිකුත් කර ඇත.

### 2.4.3 රසායනික ද්‍රව්‍ය, පොහොර, පළිබෝධනාශක හා කාර්මික අමුද්‍රව්‍ය - ඒකක 3

පසුගිය වසර 5 තුළ රසායනික ද්‍රව්‍ය සඳහා නිකුත් කළ බලපත්‍ර සංඛ්‍යාවේ ක්‍රමික වර්ධනයක් පෙන්නුම් කරයි. 2021 වර්ෂයේදී රසායනික පොහොර, පළිබෝධ නාශක හා වල්නාශක ආනයනය තහනම් කිරීමට රජය ගත් ප්‍රතිපත්තිමය තීරණය මත, එම අයිතම යටතේ ගැනෙන සංයෝජිත වර්ගීකරණ සංකේතාංක කිහිපයක් ආනයන බලපත්‍ර පාලනයට යටත් කරන ලද අතර අනෙකුත් සංයෝජිත වර්ගීකරණ සංකේතාංක ආනයනය තහනමට ලක් කරන ලදී. එලෙස බලපත්‍ර පාලනයට යටත් කරන ලද සංයෝජිත වර්ගීකරණ සංකේතාංක යටතේ කර්මාන්ත සඳහා අවශ්‍ය වන අමුද්‍රව්‍ය ආනයනය වන බැවින් කර්මාන්ත ක්ෂේත්‍රය බිඳවැටීමකට ලක් නොවී පවත්වාගෙන යාම උදෙසා එකී අමුද්‍රව්‍ය ආනයනය සඳහා බලපත්‍ර නිකුත් කරන ලදී.

සමස්ථයක් ලෙස පෙර වසරට සාපේක්ෂව මෙම වසරේ ඒකක 3හි බලපත්‍ර නිකුත් කිරීමෙහි 9% ක වර්ධනයක් පෙන්නුම් කරයි.

### 2.4.4 ජංගම දුරකථන හා සන්නිවේදන උපකරණ - ඒකක 4

පසුගිය වර්ෂ 5 ක කාලය සලකා බැලීමේදී ඒකක 4හි බලපත්‍ර නිකුත් කිරීම 2017 වර්ෂයේ සිට ක්‍රමික වර්ධනයක් පෙන්නුම් කළ ද 2020 වර්ෂයේ දී එය යම් පසුබෑමකට ලක්ව තිබේ. 2020 වර්ෂය තුළ මුළු බලපත්‍ර නිකුත් කිරීම 5083 ක් වූ අතර එය 2021 වර්ෂයේ දී 8982 ක් දක්වා වර්ධනය වී ඇත.

ඒ සඳහා බලපෑ ඇති ප්‍රධාන සාධකය ජංගම දුරකථන ආනයන ප්‍රමාණයෙහි වැඩි වීම දැක්විය හැකි අතර එය පෙර වර්ෂයට සාපේක්ෂව 85% ක ප්‍රමාණයකින් වැඩි වී ඇති බව සඳහන් කළ හැකිය. ඊට අමතරව අනෙකුත් සන්නිවේදන උපකරණ සංඛ්‍යාව ද 45% ක ප්‍රමාණයකින් වැඩිවීම ද බලපෑ ඇති බව සඳහන් කළ හැක.

කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ පාසල් හා විශ්වවිද්‍යාල පද්ධතියම මාර්ග ගත අධ්‍යාපන ක්‍රමවේදයකට අනුගත වීම නිසා එහි දී ජංගම දුරකථන හා සන්නිවේදන උපකරණ සඳහා අධික ඉල්ලුමක් ඇති වූ අතර ඊට සාපේක්ෂව සැපයුම වැඩි කිරීම සඳහා ආනයනය වැඩි විය. ඒ අනුව මෙම ක්ෂේත්‍රය තුළ වූ ආනයනකරුවන් ව්‍යාපාරික අරමුණෙන් කරනු ලැබූ ආනයන ඉහළ යාමත්, විදේශ රටවල සේවයේ නියුතු ශ්‍රී ලාංකිකයන් තම ඥාතීන් වෙත ත්‍යාග ලෙස එවනු ලැබූ ජංගම දුරකථන ප්‍රමාණය ඉහළ යාමත් නිසා නිකුත් කරන ලද බලපත්‍ර ප්‍රමාණය ඉහළ යන ලදී.

තවද 2021 වර්ෂයේ දී ගුවන් විදුලි මඟ සොයාගැනීමේ උපකරණ (Radio Navigation Equipment) බලපත්‍ර පාලනයට යටත් කළ අතර ඒ සඳහා බලපත්‍ර 19 ක් 2021 වර්ෂයේ දී නිකුත් කර ඇත.

### 2.4.5 වෙනත් ආනයන සහ අපනයන - ඒකක 5

2017 වර්ෂයේ 4,947ක් වූ වෙනත් ආනයන සහ අපනයන බලපත්‍ර සංඛ්‍යාව 2018 වර්ෂයේ දී 4,714 දක්වා අඩු වී ඇත. එහෙත්, 2018 වර්ෂයට සාපේක්ෂව 2019 වර්ෂයේ දී නැවත එම කාණ්ඩය සඳහා බලපත්‍ර නිකුත් කිරීම 4,888 දක්වා සැලකිය යුතු මට්ටමකින් ඉහළ ගිය ද, 2020 හා 2021 වර්ෂයේදී පිළිවෙළින් 4,299ක් හා 3,742ක් දක්වා විශාල ලෙස පහළ ගොස් ඇත.

2021 වර්ෂයේ දී දැවි තෙල් ආනයනය සඳහා නිකුත් කරන බලපත්‍ර ප්‍රමාණය 2020 වසර හා සසඳන විට 50% ඉක්මවූ ප්‍රතිශතයකින් පහළ ගොස් ඇත. මෙම බලපත්‍ර සංඛ්‍යාව පහළ යාම සඳහා ජුනි මාසයේ නිකුත් කරන ලද මෙහෙයුම් උපදෙස් මඟින් දැවි තෙල් සහ උපරිමය දෙදෙනෙකුට යටත්ව සුරතල් සතුන් ලෙස ආනයනය කරනු ලබන බල්ලන් හා පූසන් ශ්‍රී ලංකා රේගුවෙන් නිදහස් කිරීමට පොදු අනුමැතියක් ලබාදීම හේතු විය.

## 2.5 ආනයන හා අපනයන ගෙවීම් ක්‍රම සහ නියෝග

වාණිජ අරමුණින් සිදුකරනු ලබන ජාත්‍යන්තර වෙළඳ ගනුදෙනු නියාමනය කිරීමද දෙපාර්තමේන්තුව විසින් සිදුකරනු ලබයි. ඒ වෙනුවෙන් විදේශ වෙළඳ ගෙවීම් ක්‍රම අති විශේෂ ගැසට් පත්‍රයක් ප්‍රසිද්ධියට පත්කර ඇති අතර, එම ගෙවීම් ක්‍රම පහත සඳහන් වේ. මෙම ගෙවීම් ක්‍රම සම්බන්ධයෙන් වාණිජ බැංකු වෙත මෙහෙයුම් උපදෙස් නිරන්තරයෙන් නිකුත් කරනු ලැබේ.

1. පෙර ගෙවීම් (Advanced Payments)
2. පිළිගැනීම මත ලේඛන (Documents against Acceptance - DA)
3. ණයවර ලිපි (Letters of Credit - LC)
4. ගෙවීම් මත ලේඛන (Documents against Payment)
5. විවෘත ගිණුම් (Open Accounts - OA)
6. භාණ්ඩ විකුණන මුදල් ගෙවීමේ පදනම (Payments on Consignment Account Basis)

ඉහත සඳහන් ගෙවීම් ක්‍රමවලට අනුකූල වන ලෙස භාණ්ඩ ආනයනය කර නොමැති අවස්ථාවලදී හෝ ගෙවීම් කර නොමැති විට දී එම භාණ්ඩ ශ්‍රී ලංකා රේගුවෙන් නිදහස් කිරීමට සහ ආනයනයට අදාළ ගෙවීම් කිරීමට ඊට අදාළ කරුණු සැලකිල්ලට ගෙන ආනයන හා අපනයන පාලන

දෙපාර්තමේන්තුව විසින් අනුමැතිය ලබා දෙනු ලැබේ. ඒ අනුව, එලෙස 2021 වර්ෂයේ දී ලබාදුන් අනුමැතීන් පහත පරිදි වේ.

| 2021 වර්ෂයේ දී ප්‍රතිපත්ති අංශය විසින් ලබාදෙන ලද අනුමැතීන් | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | අනුමැතීන් වර්ග | | | | | | | | |
| මාසය | පෙර ගෙවීම | විදේශ විනිමය වැය නොවන පදනම මත ආනයනයන් | පිළිගැනීම මත ලේඛන සඳහා වන ගෙවීම | විවෘත ගිණුම මත ගෙවීම | ප්‍රති අපනයන | ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි කර්මාන්ත වලින් ඉවතලන ද්‍රව්‍ය දේශීය වෙළඳපොළට නිකුත් කිරීම | විද්‍යුත් ප්‍රේෂණ සහ ණයවර ලිපි මත ගෙවීම | වෙනත් | මුළු එකතුව |
| ජනවාරි | 12 | 95 | 43 | 27 | 05 | 02 | 09 | 03 | 196 |
| පෙබරවාරි | 04 | 381 | 50 | 52 | 04 | 01 | 19 | 02 | 513 |
| මාර්තු | 20 | 467 | 136 | 114 | 03 | 03 | 15 | 03 | 761 |
| අප්‍රේල් | 13 | 325 | 81 | 138 | 02 | 00 | 30 | 02 | 591 |
| මැයි | 14 | 319 | 47 | 48 | 00 | 00 | 23 | 00 | 451 |
| ජූනි | 08 | 308 | 26 | 19 | 07 | 01 | 16 | 01 | 386 |
| ජූලි | 14 | 334 | 49 | 45 | 05 | 01 | 18 | 01 | 467 |
| අගෝස්තු | 11 | 384 | 42 | 37 | 02 | 01 | 21 | 00 | 498 |
| සැප්තැම්බර් | 10 | 305 | 43 | 19 | 04 | 02 | 08 | 00 | 391 |
| ඔක්තොම්බර් | 14 | 304 | 86 | 40 | 08 | 00 | 09 | 05 | 466 |
| නොවැම්බර් | 10 | 383 | 60 | 38 | 01 | 02 | 16 | 04 | 514 |
| දෙසැම්බර් | 08 | 393 | 63 | 28 | 04 | 02 | 23 | 00 | 521 |
| **මුළු එකතුව** | **138** | **3,998** | **726** | **605** | **45** | **15** | **207** | **21** | **5,755** |

# 3 පරිච්ඡේදය - වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධන

## 3.1 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

**2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය**

| අයවැය 2021 රු. | | සටහන | තත්‍ය 2021 රු. | නැවත ගලපන ලද 2020 රු. | |
|---|---|---|---|---|---|
| - | ආදායම් ලැබීම් | | | | |
| - | ආදායම් බදු | 1 | | | |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | | | ඒසීඒ-1 |
| 2,800,000,000 | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | 2,934,678,721 | 2,025,977,883 | |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | | | |
| 2,800,000,000 | මුළු ආදායම් ලැබීම් (අ) | | 2,934,678,721 | 2,025,977,883 | |
| - | ආදායම් නොවන ලැබීම් | | | | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | | | ඒසීඒ-3 |
| - | තැන්පතු | | 6,028,850 | 76,127 | ඒසීඒ-4 |
| 2,500,000 | අත්තිකාරම් ගිණුම් | | 7,860,955 | 4,979,503 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම | | | | |
| 2,500,000 | මුළු ආදායම් නොවන ලැබීම් (ආ) | | **13,889,805** | 5,055,630 | |
| 2,802,500,000 | මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ) | | **2,948,568,526** | **2,031,033,513** | |
| | භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ) | | 2,852,328,152 | 1,951,427,145 | |
| | ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ) | | 96,240,374 | 79,606,368 | |
| | අඩු කළා : වියදම් | | | | |
| - | පුනරාවර්තන වියදම් | | | | |
| 53,235,000 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 53,072,395 | 49,357,389 | |
| 29,527,000 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 26,570,407 | 22,026,388 | ඒසීඒ-2(ii) |
| 938,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 932,998 | 860,600 | |
| - | පොළී ගෙවීම් | 8 | - | - | |
| - | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | - | - | |
| 83,700,000 | මුළු පුනරාවර්තන වියදම් (ඊ) | | **80,575,800** | 72,244,377 | |
| | මූලධන වියදම් | | | | |
| 1,148,505 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | 10 | 1,086,547 | 411,918 | |
| 11,000,000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම | 11 | 6,614,500 | 3,660,851 | |
| - | ප්‍රාග්ධන මාරුකිරීම් | 12 | - | - | ඒසීඒ-2(ii) |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 13 | - | - | |
| 351,495 | හැකියා වර්ධනය | 14 | 348,689 | 29,000 | |
| - | වෙනත් මූලධන වියදම් | 15 | | | |
| **12,500,000** | මුළු මූලධන වියදම් (උ) | | **8,049,736** | 4,101,769 | |
| | තැන්පතු ගෙවීම් | | 3,058,700 | 46,277 | ඒසීඒ-4 |
| 5,100,000 | අත්තිකාරම් ගෙවීම් | | 9,674,302 | 4,194,261 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම | | | | |
| | ප්‍රධාන ලෙජර් වියදම් (ඌ) | | 12,733,002 | 4,240,538 | |
| | මුළු වියදම් එ = (ඊ+උ+ඌ) | | 101,358,538 | 80,586,684 | |
| 5,100,000 | දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ) | | (5,118,164) | (980,316) | |
| | අනුම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය | | (5,118,164) | (980,316) | ඒසීඒ-7 |
| | දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය | | - | - | ඒසීඒ-3 |

1

## 3.2 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-8

**2021 දෙසැම්බර් 31 දිනට**
**මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය**

| | සටහන | සත්‍ය 2021 රු. | 2020 රු. |
|---|---|---|---|
| **මූල්‍ය නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 43,050,038 | 35,966,038 |
| **මූල්‍ය වත්කම්** | | | |
| අත්තිකාරම් ගිණුම | ඒසීඒ-5/5(ඒ) | 15,193,990 | 13,380,644 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | | |
| **මුළු වත්කම්** | | **58,244,028** | **49,346,682** |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | | |
| භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් | | 12,193,990 | 13,350,794 |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 43,050,038 | 35,966,038 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | **ඒසීඒ-5(බී)** | | |
| **ජංගම වගකීම්** | | | |
| තැන්පතු ගිණුම | ඒසීඒ-4 | 3,000,000 | 29,850 |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | | |
| **මුළු වගකීම්** | | **58,244,028** | **49,346,682** |

පිටු අංක 07 සිට 46 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 47 සිට 55 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තගර්ත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් වාතර්ාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

| | | |
|---|---|---|
| ප්‍රධාන ගණන්දීමේ නිලධාරී | ගණන්දීමේ නිලධාරී | ප්‍රධාන මූල්‍ය නිලධාරී/ප්‍රධාන ගණකාධිකාරී/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්) |
| නම : | නම : | නම : |
| තනතුර : | තනතුර : | |
| දිනය : 23/2/22 | | දිනය : 22/02/22 |

එස්. ආර්. ආටිගල
මහා භාණ්ඩාගාරයේ සහ මුදල් අමාත්‍යාංශයේ ලේකම්
මුදල් අමාත්‍යාංශය
මහලේකම් කාර්යාලය
කොළඹ 01.

ඩී.ඩබ්.බී. [illegible]
ආනයන හා අපනයන පාලන [illegible]

අයි. පී. [illegible]
ප්‍රධාන ගණකාධිකාරී
ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව
කොළඹ 01.

2

## 3.3 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

එසීඑ-සී

**2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| | සත්‍ය 2021 රු. | නැවත සකසන ලද 2,020 රු. |
|---|---|---|
| <u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| මුළු බදු ලැබීම් | | |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | 2,934,678,721 | 2,025,977,883 |
| ලාභ | | |
| ආදායම් නොවන ලැබීම් | 3,103,419 | 2,883,484 |
| වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | | |
| අග්‍රිම ලැබීම් | | |
| අත්තිකාරම් අයකර ගැනීම් | 4,054,546 | 3,654,929 |
| තැන්පතු ලැබීම් | 6,028,850 | 76,127 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | **2,947,865,536** | **2,032,592,423** |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 79,151,062 | 70,721,851 |
| සහනාධාර සහ මාරුකිරීම් | 932,998 | 860,600 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | 140,000 | 1,240,520 |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | 2,852,328,152 | 1,951,427,145 |
| අත්තිකාරම් ගෙවීම් | 4,204,888 | 46,277 |
| තැන්පතු ගෙවීම් | 3,058,700 | 4,194,261 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | **2,939,815,800** | **2,028,490,654** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ )=(අ)-(ආ)** | **8,049,736** | **4,101,769** |
| <u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| පොලී | | |
| ලාභාංශ | | |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | | |
| උපණය අයකර ගැනීම් | | |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)** | - | - |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | |
| භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් | 8,049,736 | 4,101,769 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | **8,049,736** | **4,101,769** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ( ඊ)=(ඈ)-(ඉ)** | **(8,049,736)** | **(4,101,769)** |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=( ඇ) + (ඊ)** | - | - |
| <u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| දේශීය ණය ගැනීම් | - | - |
| විදේශීය ණය ගැනීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)** | - | - |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)** | - | - |
| **මුදල්වල ශුද්ධ වෙනස්වීම (ඔ) = (උ)+(ඒ)** | - | - |
| **ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය** | - | - |
| **දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | - | - |

3

### 3.4 ආදායම් එකතු කිරීමේ කාර්යසාධන

රු. '000

| ආදායම් කේතය | ආදායම් කේතයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | එකතු කරන ලද ආදායම | |
|---|---|---|---|---|---|
| | | මුල් ඇස්තමේන්තුව | අවසන් ඇස්තමේන්තුව | ප්‍රමාණය (රු.) | අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස |
| 10.01.03.00 | ආනයන හා අපනයන බලපත්‍ර සහ අතිරේක ගාස්තු | 1,450,000 | 2,800,000 | 2,934,679 | 104.8 % |

#### 3.4.1 පසුගිය වර්ෂ 4ක ආනයන හා අපනයන පාලන බලපත්‍ර සහ අතිරේක ගාස්තුවල වටිනාකම

රු. '000

| වර්ෂය | 2018 | 2019 | 2020 | 2021 |
|---|---|---|---|---|
| ශුද්ධ ආදායම | 1,554,482 | 1,542,977 | 2,025,978 | 2,934,679 |




දෙපාර්තමේන්තුවේ පසුගිය වසර 4ක බලපත්‍ර ආදායම පිළිබඳව සලකා බැලීමේදී ආදායමේ ක්‍රමික වැඩිවීමක් දක්නට ලැබේ. 2021 වර්ෂයේ බලපත්‍ර නිකුත් කිරීමෙන් රුපියල් බිලියන 2.93 ක් වැනි ඉහළ ආදායමක් ඉපයීමට සමත් වී ඇති අතර එය 2020 වර්ෂය සමග සසදා බැලීමේ දී 45.04% ක ශීඝ්‍ර

වැඩිවීමකි. තවද ආනයන පාලන රෙගුලාසි උල්ලංඝනය කරන ලද අවස්ථා වලදී අතිරේක ගාස්තු අයකිරීම ද සිදු කරන ලදී.

### 3.5 2021 වර්ෂය සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය

රු. '000

| ප්‍රතිපාදන වර්ගය | වෙන්කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදනය | අවසාන ප්‍රතිපාදනය | | |
| පුනරාවර්තන | 83,700 | 83,700 | 80,575.80 | 96% |
| ප්‍රාග්ධන | 12,500 | 12,500 | 8,049.73 | 64% |

2020 වර්ෂය සමග සැසඳීමේ දී 2021 වර්ෂයේ දෙපාර්තමේන්තුවේ පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් උපයෝගී කරගනු ලැබූ අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස සලකා බැලීමේ දී පෙර වර්ෂයට සාපේක්ෂව පුනරාවර්තන වියදම්වල 1%ක වැඩිවීමක් ද ප්‍රාග්ධන වියදම්වල 25% ක ප්‍රමාණයකින් අඩු වීමක් ද දක්නට ඇත. මෙහිදී කොවිඩ්-19 ව්‍යාප්ත වීම මත සීමිත සේවක පිරිසක් සේවයේ යෙදවීමත් ඒ මත සම්පත් උපයෝජනය අඩු මට්ටමක පැවතීමත් හේතු වී ඇත.

**3.6** මු.රෙ. **208** ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන නොමැත.

**3.7** මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

රු. ‘000

| වත්කම් කේතය | කේත විස්තරය | 31.12.2021 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | 31.12.2021 දිනට මූලය තත්ත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි හා ව්‍යුහයන් | - | | | |
| 9152 | යන්ත්‍රෝපකරණ | - | 42,164 | | |
| 9153 | ඉඩම් | - | | | |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | - | 886 | | |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | - | | | |
| 9160 | කෙරීගෙන යන වැඩ | - | | | |
| 9180 | බදු දෙන ලද වත්කම් | - | | | |

## 3.8 විගණකාධිපතිවරයගේ වාර්තාව


ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE


මගේ අංකය / எனது இல. / My No. PUR/A/IECD/2021/F.A  ඔබේ අංකය / உமது இல. / Your No.  දිනය / திகதி / Date 2022 මැයි 24 දින

ආනයන හා අපනයන පාලන ජනරාල්,

ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව.

**ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (1) වගන්තිය ප්‍රකාරව ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (2) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව පසුව නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.


අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.  இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.  No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34  +94 11 2 88 72 23  ag@auditorgeneral.gov.lk  www.naosl.gov.lk

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) වගන්තිය ප්‍රකාරව ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම් වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38 (1) (ඇ) උප වගන්තිය ප්‍රකාරව ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින්කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදි. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදි.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශය

1.6.1.1 තැන්පතු ගිණුම

තැන්පතු අංක 6000-0-0-18-127 දරන ව්‍යවස්ථාපිත ගෙවීම් වෙනුවෙන් වූ තාවකාලික රඳවා ගැනීමේ ගිණුමෙහි 2021 දෙසැම්බර් 31 දිනට ශේෂය දෙපාර්තමේන්තු පොත් අනුව රු.3,000,000 ක් වූවද, එය භාණ්ඩාගාර පොත් අනුව රු.2,995,025 ක් වීමෙන් රු.4,975 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර එම වෙනසට හේතු මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

1.6.2 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ 2021 නොවැම්බර් 26 දිනැති අංක 2021/03 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශය 7.6 ඡේදය ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේදී මුදල් සහ හරස් සටහන් යන දෙකම සැලකිල්ලට ගත යුතු වුවද, හරස් සටහන් මගින් අත්තිකාරම් අයකර ගැනීම් රු.3,806,409 ක් ද අත්තිකාරම් පියවීම් රු.5,469,414 ක් ද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා නොතිබීමෙන් මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය රු.1,663,005 කින් අඩුවෙන් දක්වා තිබුණි.

1.6.3 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

(අ) ඇප ලේඛනය

මුදල් රෙගුලාසි 891 (1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන්ගේ නම් ඇතුළත් ඇප ලේඛනයක් අකාරාදී ක්‍රමයට පිළියෙල කොට පවත්වාගෙන යා යුතු වුවත්, දෙපාර්තමේන්තුවේ ඇප තැබිය යුතු නිලධාරීන් 13 ක් සිටියද එවැනි ලේඛනයක් යාවත්කාලීනව පවත්වාගෙන යාමට කටයුතු කර නොතිබුණි.

(ආ) වාහන ලොග් පොත්

මුදල් රෙගුලාසි 1645 (අ) හි දැක්වෙන විධිවිධාන ප්‍රකාර වාහන ලොග් පොත් සෑම වාහනයක් සම්බන්ධයෙන්ම යාවත්කාලීනව පවත්වාගත යුතු වුවද, දෙපාර්තමේන්තු වාහන ඇණියට අදාල ලොග්පොත්වල වාහනය පිළිබඳ විස්තරයෙහි ඇතුළත් විය යුතු කරුණු නිසි පරිදි සම්පූර්ණකර නොතිබූ බව නිරීක්ෂණය විය.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය

සමාලෝචිත වර්ෂයේ දි ආදායම් සංකේත අංක 1001-0-3-0-0-0 බලපත්‍ර ආදායම් සඳහා මුලික ඇස්තමේන්තුව රු.1,450,000 ක් වූ අතර සංශෝධිත ඇස්තමේන්තුව රු.2,800,000 ක් විමෙන් රු.1,350,000 ක විචලතාවයක් නිරීක්ෂණය වූ අතර එය මුලික ඇස්තමේන්තුවෙන් සියයට 93 ක විචලතාවයකි. එබැවින් මුලික ඇස්තමේන්තු සකස් කිරීමේදි හැකිතාක් නිවැරදිව ඇස්තමේන්තු පුරෝකථනය කිරීමේ අවශ්‍යතාවය විගණනයේදි නිරීක්ෂණය කෙරේ.

### 2.2 වියදම් කළමනාකරණය

#### 2.2.1 පුනරාවර්තන වියදම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදි පුනරාවර්තන වියදම්හි වැය විෂයයන් 04 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 6 සිට සියයට 100 ක් දක්වා වූ පරාසයක ප්‍රතිපාදන ඉතිරිවීමක් නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂයේදි පුනරාවර්තන වැය විෂය 09 ක මුලික ඇස්තමේන්තු හා සංශෝධිත වියදම් ඇස්තමේන්තු අතර සියයට 16 සිට සියයට 76 දක්වා වූ පරාසයක විචලතාවයක් නිරීක්ෂණය විය. ඒ අනුව මුලික ඇස්තමේන්තු සකස් කිරීමේදි පසුගිය වර්ෂයන්හි වියදම් පිළිබඳ සමාලෝචනයක් සිදු කර හැකිතාක් නිවැරදිව වියදම් ඇස්තමේන්තු පුරෝකථනය කිරීමේ අවශ්‍යතාවය විගණනයේදි නිරීක්ෂණය විය.

#### 2.2.2 මූලධන වියදම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදි මූලධන වැය විෂයයන් 03 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 38 සිට සියයට 61 ක් දක්වා වූ පරාසයක ප්‍රතිපාදන ඉතිරිවීම් පැවති බව නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා වූ මූලධන වැය විෂයය දෙකක ප්‍රතිපාදන මු.රෙ 66/69 විරමෝං ක්‍රියාපටිපාටිය මගින් වෙනස් කර තිබුණි. ඒ හේතුවෙන් එම වැය විෂයයන් දෙකෙහි මුලික ඇස්තමේන්තු හා සංශෝධිත ඇස්තමේන්තු අතර විචලතාවය සියයට 65 ක් සහ 162 ක් බව නිරීක්ෂණය විය. ඒ අනුව මුලික ඇස්තමේන්තු සකස් කිරීමේදි පසුගිය වර්ෂයන්හි වියදම් පිළිබඳ සමාලෝචනයක් සිදු කර හැකිතාක් නිවැරදිව වියදම් ඇස්තමේන්තු පුරෝකථනය කිරීමේ අවශ්‍යතාවය විගණනයේදි නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

### 2.2.3 අත්තිකාරම් ගිණුම

සේවය හැරගොස් ඇති කළමනාකරණ සහකාර නිලධාරී මහතෙකුගෙන් වසර 04 ක් තිස්සේ අයවිය යුතු රු. 335,753 ක ණය ශේෂයක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකර ගැනීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

### 2.3 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

### 2.4 නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1987 ජුනි 20 දිනැති අංක 1978 අංක 28 දරන පනතින් සංශෝධිත 1969 අංක 01 දරන ආනයන හා අපනයන පාලන පනතේ 11 E වගන්තිය | ප්‍රමිතියට පටහැනිව ආනයන සිදු කරන ආනයනකරුවන් ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කළ යුතු වුවද, දෙපාර්තමේන්තුව විසින් එසේ කර නොතිබුණි. |
| (ආ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය 3.1 ඡේදය | සෑම ඉන්ධන පරීක්ෂාවකට පසු මාස 12 ක කාල සීමාවකින් පසුව හෝ කිලෝ මීටර 25,000 ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ යන කාරණා අතරින් මුලින්ම යෙදෙන අවස්ථාවට පසුව ඉන්ධන පරීක්ෂාවක් කළ යුතු වුවද දෙපාර්තමේන්තුවේ වාහන 07 න් 06 ක් සඳහා එසේ පරීක්ෂාවන් සිදු කර නොතිබුණි. |

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

-----------------------------------

| | |
|---|---|
| (i) මු.රෙ. 1647 (ඉ) | වාහන භාර නිලධාරීන් විසින් තමා භාරයේ ඇති මෝටර් වාහන වර්ගය, මෝස්තරය, ලියාපදිංචි අංකය හා ඒ පිළිබඳ තොරතුරු ඇතුලත් කර මෝටර් වාහන ලැයිස්තුවක් පවත්වාගෙන යා යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 1646 | වාහන භාර නිලධාරීන් විසින් ඊළග මාසයේ 15 දින ගතවීමට ප්‍රථමව 268 (අ) වැනි ආකෘති පත්‍රයෙහි ලියන ලද ගමන් පිළිබද මාසික සාරාංශයේ මුල් පිටපතද සමඟ ඒ ඒ මාසයේ දෛනික ධාවන සටහන් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 371(2) (ආ) | කිසියම් විශේෂිත කාර්යයක් සඳහා මාණ්ඩලික තත්වයේ නිලධාරින්ට පමණක් ලබාදෙන රු.100,000/- ක උපරිමය යටතේ වූ තත්කාර්යය අතුරු අග්‍රිමය අදාල විශේෂිත කාර්යයට ආසන්නතම දිනයකදී නිලධාරියා වෙත ලබාදියයුතු අතර නිලධාරියා විසින් එම කාර්යය නිමකල විගසම අග්‍රිමය පියවිය යුතුය. එසේ වුවද දෙපාර්තමේන්තුවේ ඇතැම් නිලධාරීන් 5 දෙනෙකු ලබාගත් රු. 2,500 සිට රු. 50,000 ක් දක්වා පරාසයක අත්තිකාරම් මුදල් පියවීම සඳහා දින 32 සිට 160 ක කාලපරාසයක් ගතකර තිබුණි. |
| (iv) මුදල් රෙගුලාසි 756 (6) | වාර්ෂික තොග සමීක්ෂණ වාර්තා ඉදිරි මුදල් වර්ෂයේ මාර්තු 31 දිනට පෙර විගණකාධිපති වෙත යොමු කළ යුතු වුවද එසේ කර නොතිබුණි. |

3. මෙහෙයුම් සමාලෝචනය

3.1. දැක්ම හා මෙහෙවර

1969 ජනවාරි 16 දිනැති අංක 1969 අංක 01 දරන ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව පිහිටුවීමේ අරමුණ, දැක්ම හා මෙහෙවර අනුව ශ්‍රී ලංකාවේ ආර්ථිකයට අහිතකර ලෙස බලපාන ආනයනයන් හා අපනයනයන් පාලනය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතු වේ. එහෙත් වර්තමානයේදී එක් එක් විෂයන්ට අදාල ආයතන විසින් කරනු ලබන ඉල්ලීම් මත පමණක් පදනම්ව කටයුතු කර තිබුණි. එබැවින් මෙම දෙපාර්තමේන්තුව පිහිටුවීමේ මූලික අරමුණ ඉටු වන ආකාරයට කටයුතු කිරීම සඳහා පිළිගත් විද්‍යාත්මක ක්‍රමවේදයක් හෝ ක්‍රියා පටිපාටියක් නොමැති බව විගණනයට නිරීක්ෂණය වන අතර බලපත්‍ර ගාස්තු අය කිරීම පමණක් ප්‍රධාන කාර්යය ලෙස කටයුතු කරන බව නිරීක්ෂණය වුණි.

3.2 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

ආනයන අපනයන පාලන දෙපාර්තමේන්තුව විසින් මෘදුකාංග සංවර්ධනය සඳහා අනුමත කරන ලද ආයතන සමඟ මෘදුකාංග පද්ධති සම්බන්ධ කිරීම, ජාලගත වීම හා ජාලගත අයදුම්පත්‍ර ඉදිරිපත් කිරීම වැනි කටයුතු සිදු කිරීම සඳහා ICTA ආයතනය සමඟ 2017 පෙබරවාරි 03 දින අවබෝධතා ගිවිසුම අත්සන් කර තිබූ අතර ඒ අනුව අරමුදල් සැපයීම ICTA ආයතනය විසින් සිදු කර තිබුණි. නමුත් මේ සඳහා විසර්ජන පනතින් ද 2017 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා රු.9,080,000 ක් ලබාගෙන තිබුණු අතර ඉන් රු. 8,119,035 ක් වියදම් කර තිබුණි. එහෙත් මෙම ව්‍යාපෘතිය අවසන් කිරීමට සමාලෝචිත වර්ෂය තුළ ද කටයුතු කර නොතිබුණි.

3.3 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආනයනයන් සීමා කළ යුතු හා තහනම් කළ යුතු භාණ්ඩ ආනයනයෙන් වැලැක්වීම සඳහා වූ විධිවිධාන ඇතුළත් අංක 2044/40 සහ 2017 නොවැම්බර් 09 දිනැති ගැසට් පත්‍රය මගින් හා පැරණි වාහන රට තුළට ඒම සීමා කිරීම සඳහා වූ 2016 ජුනි 14 දිනැති අංක 1971/10 දරන ගැසට් පත්‍රය මගින් නීති විරෝධී ආනයනයන් රටතුළට ඒම වළක්වා තිබුණි. එහෙත් රේගු දෙපාර්තමේන්තුව අතර අන්තර් සම්බන්ධතාවයක් නොපැවතීම හා දෙපාර්තමේන්තුවේ පාලන පද්ධතියේ පවතින දුර්වලතා හේතුවෙන් ආනයන බලපත්‍ර නිකුත් කිරීමෙන් පසු ඒ සම්බන්ධව පසුවිපරම් කිරීමේ ක්‍රමවේදයක් දෙපාර්තමේන්තුව සතුව නොපැවතුණි.

(ආ) ජාතික ආර්ථිකය සතු විනිමය රට තුළ රඳවා ගැනීම වෙනුවෙන් ඇතැම් භාණ්ඩ ආනයනය සඳහා සීමා පනවා තිබුණු අතර ඒ පිළිබඳව පහත කරුණු නිරීක්ෂණය විය.

(i) දෙපාර්තමේන්තුවේ "කොවිඩ් 19" නමින් අංශයක් පිහිටුවා ආනයනය තාවකාලිකව අත්හිට වූ භාණ්ඩ ආනයනය සඳහා ආනයනකරුවන් වෙත විශේෂ අවසර පත්‍ර නිකුත් කිරීමට කටයුතු කර තිබුණි. එහෙත් වර්ෂය තුළදී රැස් කරන ලද අවසර පත්‍රවල ලැයිස්තුවක් දෙපාර්තමේන්තුවේ එම අංශය සතුව නොතිබීම නිසා තාවකාලිකව ආනයනය තහනම් කළ භාණ්ඩ කොතරම් ප්‍රමාණයකට අවසර පත්‍ර ලබාදී තිබුණේ දැයි තහවුරු කර ගැනීමට විගණනයට සාක්ෂි නොලැබුණි.

(ii) අසම්පූර්ණ අයදුම්පත් සඳහා ද අවසර පත්‍ර නිකුත් කර තිබුණු අතර අදාල අයදුම්පත් නිසි පරිදි ගොනු ගත කර ද නොතිබුණි.

(iii) 2021 ජූනි 21 දිනැති අංක 2231/18 ගැසට් පත්‍රයේ 8 ඡේදයේ සඳහන් කර තිබූ පාලනයෙන් බැහැරවද භාණ්ඩ ආනයනය කළ අවස්ථා පැවතීම මෙන්ම ආනයන සීමා කර තිබුණ ද පසුගිය වර්ෂ 05 සමඟ සංසන්දනය කර බැලීමේදී සමාලෝචිත වර්ෂයේ නිකුත් කර තිබූ ආනයන බලපත්‍ර සංඛ්‍යාව සීඝ්‍ර ලෙස ඉහළ ගොස් තිබීමෙන් ආනයන මත සම්භාධක පැනවීමෙන් අපේක්ෂිත ප්‍රතිඵල ලැබී නොමැති අවස්ථා පැවති බවද නිරීක්ෂණය විම.

(iv) කොවිඩ් 19 වසංගතය පැවතීම පෙර වර්ෂය වන 2018 වර්ෂයේ මුළු ආනයන බලපත්‍ර ආදායම රු. 1,538,768,820 ක් වුවද ඊට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ බලපත්‍ර ආදායම රු. 2,919,751,995 ක් වීමෙන් බලපත්‍ර ආදායමේ සියයට 47 ක වැඩි වීමක් සිදුවීමෙන් නිරීක්ෂණය වන්නේ පාලනයන්ගෙන් බැහැරව ආනයන වැඩි වී ඇති බව වේ.

(ඇ) රජය සතු පොහොර සමාගමක් විසින් 2021 ඔක්තෝබර් මාසයේදි බලපත්‍රයක් රහිතව ආනයනය කරන ලද පොහොර තොගයක් වෙනුවෙන් අයකළ යුතුව තිබූ අතිරේක ගාස්තුව වූ රු. 86,907,433 ක ආදායම අය නොකිරීමෙන් එම වටිනාකමෙන් දෙපාර්තමේන්තුවේ ආදායම අහිමි වී තිබුණි.

(ඈ) සීනි කිලෝග්‍රෑම් එකක් සඳහා පනවා තිබුණු විශේෂ භාණ්ඩ බදු රු. 50 සිට ශත 25 දක්වා අඩු කිරීමෙන් බලාපොරොත්තු වූ සහනය පාරිභෝගික ජනතාවට ලැබීම පිළිබඳව අධ්‍යයනය කිරීම සඳහා වූ විශේෂ විගණනයේ දී පහත සඳහන් නිරීක්ෂණ සිදු කෙරුණි.

(i) ආනයනික සීනි සඳහා බලපත්‍ර ක්‍රමයක් හඳුන්වා දෙමින් 2020 ඔක්තෝබර් 29 දිනැති අංක 2199/20 දරන අති විශේෂ ගැසට් පත්‍රය නිකුත් කිරීමට මුදල් අමාත්‍යවරයා විසින් කටයුතු කර තිබුණ ද මේ සඳහා අනුගමනය කළ යුතු ක්‍රමවේදයන් පිළිබඳ යම් උපදෙසක් මුදල් අමාත්‍යාංශය විසින් ලබා දී ඇති බව

නිරීක්ෂණය නොවිය. ඒ අනුව සීනි ආනයනය පාලනය කිරීමට අවශ්‍ය නිර්ණායක හඳුන්වා දීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් සීනි ආනයනය සඳහා ඉල්ලුම්පත් ඉදිරිපත් කළ සියලුම ඉල්ලුම්කරුවන්ට ඔවුන් ආනයනය කිරීමට ඉල්ලුම් කළ සියලු තොගයන් ආනයනය කිරීමට ආනයන හා අපනයන පාලක විසින් අනුමැතිය ලබාදී තිබුණි. ඒ අනුව මෙලෙස ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව විසින් සිය වෘත්තීමය වගකීම මැණවින් ඉටුකර නොමැතිවීම හේතුවෙන් ආනයන බලපත්‍ර හඳුන්වා දීම මඟින් ආනයනය පාලනය කිරීමේ හෝ විනිමය ගලායාම පාලනය කිරීමේ රජයේ අපේක්ෂාවන් බලාපොරොත්තු වූ පරිදි ඉටු වී නොතිබුණි.

(ii) සීනි ආනයනය සඳහා වන බලපත්‍ර ක්‍රමය 2020 ඔක්තෝබර් 30 දින සිට ක්‍රියාත්මක වුවද බලපත්‍ර නිකුත් කිරීම 2020 නොවැම්බර් 18 වන දින දක්වා ප්‍රමාද වී ක්‍රියාත්මක කර තිබුණි. ඒ අනුව බලපත්‍ර ක්‍රමය හඳුන්වාදීමෙන් පසුව බලපත්‍ර නිකුත් කිරීම ප්‍රමාද කළ කාල පරිච්ඡේදය තුළ සීනි මෙ.ටො. 101,527 ක් බලපත්‍ර නොමැතිව ආනයනය කිරීමට ආනයනකරුවන් 18 ක් කටයුතු කර තිබුණි.

(iii) 2016 පෙබරවාරි 11 දිනැති අංක 1953/28 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව බලපත්‍ර නොමැතිව ආනයනය කරන ලද භාණ්ඩ සඳහා මි.ර.ගැ වටිනාකමින් සියයට 05 ක අතිරේක ගාස්තුවක් අය කළ යුතු වුවද ආනයන බලපත්‍ර නොමැතිව ආනයනය කර තිබූ සීනි තොගවල මි.ර.ගැ වටිනාකමින් සියයට 2 ක් පමණක් අය කිරීමට ආනයන හා අපනයන (පාලන) ජනරාල් විසින් තීරණය කර තිබුණි. එලෙස දඩ මුදල අඩුකර අය කිරීම සඳහා ආනයන අපනයන දෙපාර්තමේන්තුවට බලතල ඇතිබව නිරීක්ෂණය නොවූ අතර බලපත්‍ර රහිතව ආනයනය කර තිබූ සීනි මෙ.ටො. 294,085 ක් සඳහා එලෙස ගාස්තු අඩු කිරීම හේතුවෙන් රජයට අයවිය යුතු රු.433,523,216 ක මුදලක් අහිමි වී තිබුණි.

(iv) සීනි සඳහා ආනයන බලපත්‍ර නිකුත් කිරීමේ ප්‍රධාන අරමුණක් වශයෙන් නිරීක්ෂණය වන්නේ බදු අඩු කිරීමෙන් පසු විශාල වශයෙන් සීනි ආනයනය කිරීම පාලනය කිරීම වේ. එහෙත් බලපත්‍ර නිකුත් කිරීමට පෙර මාසික සාමාන්‍යය ආනයනය කළ මෙ.ටො. ප්‍රමාණය 41,779 ක් වූ අතර බලපත්‍ර ක්‍රමය හඳුන්වා දීමෙන් පසු එය මාසිකව මෙ.ටො 61,714 ක් පමණ වන අතර එය සියයට 47 කින් පමණ ආනයන වැඩිවීමකි. ඒ අනුව බලපත්‍ර ක්‍රමයක් හඳුන්වා දීම තුළින් අපේක්ෂිත අරමුණු ඉටු වී ඇති බවක් නිරීක්ෂණය නොවිය.

## 4. මානව සම්පත් කළමනාකරණය

### 4.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම

සමාලෝචිත වර්ෂයේ අනුමත, තථ්‍ය, පුරප්පාඩු හා අතිරික්ත කාර්ය මණ්ඩලය පිළිබඳ 2021 දෙසැම්බර් 31 දිනට විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් දෙපාර්තමේන්තුව විසින් පඩිනඩි කාණ්ඩය වෙනුවෙන් රු.මිලියන 53 ක් වැය කර තිබුණි. ඒ අනුව ඒක පුද්ගල වියදම රු. මිලියන 0.58 ක් වී තිබුණි.

| සේවක වර්ගය | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 13 | 09 | 04 |
| තෘතියික මට්ටම | 04 | 02 | 02 |
| ද්විතික මට්ටම | 75 | 65 | 10 |
| ප්‍රාථමික මට්ටම | 20 | 15 | 05 |
| එකතුව | 112 | 91 | 21 |

ආර්.ආර්.එම්. අබේසිංහ බංඩා
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

## 4 පරිච්ඡේදය - කාර්යසාධන දර්ශකය

### 4.1 ආයතනයේ කාර්යසාධන දර්ශකය (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුම් ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | | |
|---|---|---|---|---|
| | 100% - 90% | 75% - 89% | 50% - 74% | 49% - 0% |
| ආනයන හා අපනයන පාලන බලපත්‍ර නිකුත් කිරීම හා හර කිරීම | √ | | | |
| ගැසට් ප්‍රකාශනය | | √ | | |
| මාර්ගෝපදේශ හා ප්‍රතිපත්ති සම්පාදනය කිරීම | | √ | | |
| පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | | | | √ |

- 2021 වර්ෂය තුළ ප්‍රකාශයට පත්කිරීම සඳහා සැළසුම් කරන ලද ආනයන හා අපනයන පාලන බලපත්‍ර ගාස්තු, තත්ත්ව පාලන හා ප්‍රමිතකරණ සහ පූර්ව නැව්ගත කිරීමේ පරීක්ෂණ සහතික ගැසට් නිවේදන ප්‍රකාශයට පත්කිරීමට අදාළව සාකච්ඡාවන් කිහිපයක් පැවැත්වීමෙන් අනතුරුව අදාළ කෙටුම්පත් කිරීමේ කටයුතු අවසන් කර ඇත. වර්ෂයේ සිට පැවති කොවිඩ්19 වසංගත තත්ත්වය මත ආර්ථිකය කෙරෙහි ඇති වූ බලපෑම ක්‍රමයෙන් අඩුවීමත් සමග අත්‍යවශ්‍ය ආනයනික භාණ්ඩ මත පනවා තිබූ යම් යම් සීමාකිරීම් ලිහිල් කිරීමටත් දේශීය නිෂ්පාදන කර්මාන්ත දිරිගැන්වීමේ අරමුණින් දේශීය වශයෙන් නිපදවනු ලබන යම් යම් භාණ්ඩ මත පනවා තිබූ ආනයන සීමාකිරීම් තවදුරටත් පවත්වාගෙන යාමටත් ගැසට් පත්‍ර 14 ක් මෙම වර්ෂය තුළ ප්‍රකාශයට පත්කරන ලදී.

- 2020 ට සාපේක්ෂව 2021 වර්ෂයේ දී මාර්ගෝපදේශ හා ප්‍රතිපත්ති සම්පාදන කටයුතුවල සැලකිය යුතු වර්ධනයක් දක්නට ඇත.

- කොවිඩ් -19 තත්ත්වය මත රජය විසින් නිකුත් කරන ලද සෞඛ්‍ය මාර්ගෝපදේශවන්ට අනුකූලව පුද්ගලයන් ඒකරාශිකර සිදුකරනු ලබන පුහුණු වැඩසටහන් බොහොමයක් ක්‍රියාත්මක කිරීම තවදුරටත් සීමා කිරීමට සිදුවීම මත එම ප්‍රතිශතය අවම මට්ටමක පවතින ලදී.

## 5 පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සාක්ෂාත් කරගැනීමේ කාර්යසාධනය

2015 වසරේදී එක්සත් ජාතීන්ගේ සමුළුවේදී ලෝක රාජ්‍ය නායකයන් විසින් ගෝලීය වශයෙන් 2030 වසරේදී ළඟා විය යුතු තිරසාර සංවර්ධන අරමුණු 17 සහ ඉලක්ක 169 හඳුන්වා දෙන ලදී. තිරසාර සංවර්ධනය සඳහා 2030 න්‍යාය පත්‍රයෙහි මානවයා, මිහිකත සහ සෞභාග්‍ය වෙනුවෙන් වන්නා වූ ක්‍රියාකාරී සැලසුම්, පුළුල් නිදහස තුළ විශ්වීය සාමය ශක්තිමත් කිරීමේ වෑයම්, අන්ත දරිද්‍රතාවය ඇතුළු දිළිඳු බවෙහි ස්වරූපයන් තුරන් කිරීම, මානව හිමිකම්, ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ කාන්තාවන්, ගැහැනු ළමුන් සවිබල ගැන්වීම සාක්ෂාත් කර ගැනීම සහ සියලු පාර්ශ්වකරුවන්ගේ සහයෝගී ක්‍රියාකාරිත්වය මේ අතර වේ.

ගෝලීය තිරසාර සංවර්ධනයට ප්‍රවේශයක් ලෙස ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආයතනයන් ඊට අනුගත වීම සහ දිගුකාලීන සංවර්ධන උපායමාර්ග ක්‍රියාත්මක කිරීම සඳහා වූ අවශ්‍යතාවය පිළිබඳව තිරසාර සංවර්ධන සභාව අනුග්‍රහයෙන් පවත්වන ලද වැඩමුළු සඳහා මෙම දෙපාර්තමේන්තුවේ නිලධාරින් සහභාගී විය. ඒ අනුව දෙපාර්තමේන්තුවේ දැක්ම, මෙහෙවර සහ කාර්යභාරය පදනම් කරගනිමින් දෙපාර්තමේන්තුවට අදාළ ගෝලීය තිරසාර සංවර්ධන අරමුණු සහ ඉලක්කයන් හඳුනාගැනීමක් සිදුවිය. පසුව දෙපාර්තමේන්තු අභිලාෂයන් මුදුන්පත් වන පරිදි දිගුකාලීන දැක්මකින් යුතුව තිරසාර සංවර්ධන අරමුණු හා එහි ප්‍රගතිය මැනීම සඳහා වූ නිර්ණායකයන් ස්ථාපිත කරගන්නා ලදී. ස්ථාපිත කරගත් අරමුණු තුළින් රටේ තිරසාර සංවර්ධනය සඳහා වූ කාලීන අවශ්‍යතාවය සැපිරීම උදෙසා අප දෙපාර්තමේන්තුව ක්‍රියාකාරකම් ආරම්භ කොට ඇත. දෙපාර්තමේන්තුවට අදාළව අරමුණු සකස්කර ගැනීමේදී පාදක කරගන්නා ලද තිරසාර සංවර්ධන අරමුණු පහත පරිදි වේ.

### 5.1 හඳුනා ගන්නා ලද තිරසාර සංවර්ධන අරමුණු

**නගර සහ ජනාවාස පරිපූර්ණ ආරක්ෂිත, සවිමත් සහ තිරසාර ලෙස සකස් කිරීම. (තිරසාර සංවර්ධන අරමුණු අංක 11)**

ජීවත්වීම උදෙසා හිතකර පරිසරයක් රට තුළ ගොඩනැගීම සඳහා වාතයේ ගුණාත්මකභාවය තහවුරු කිරීම සහ නාගරික සහ වෙනත් අපද්‍රව්‍ය කළමනාකරණය සිදුකළ යුතු ය. නාගරීකරණය වූ ප්‍රදේශවල රථවාහන භාවිතය ශීඝ්‍රයෙන් ඉහළ යාම හේතුවෙන් එම ප්‍රදේශයන්හි වාතයේ අඩංගු විමෝචන වායු ප්‍රතිශතයේද වැඩිවීමක් දක්නට ඇත. මෙහිදී අවධානයට ලක් වූ කරුණ නම් රථවාහනවලින් පිටවන විෂ දුමාරය මඟින් සැළකිය යුතු මට්ටමක වායු දූෂණයක් සිදුවන බවයි. එබැවින් වායු විමෝචන ප්‍රමිතීන්ට අනුකූල නොවන වාහන ශ්‍රී ලංකා රේගුව හරහා නිදහස් කිරීමට අවසර ලබා නොදෙන ලදී.

**තිරසාර පරිභෝජනය සහ නිෂ්පාදන රටාවක් සහතික කිරීම. (තිරසාර සංවර්ධන අරමුණු අංක 12)**

පරිසර හිතකාමී ලෙස රසායනික ද්‍රව්‍ය සහ සියලුම අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම තුළින් මානව සෞඛ්‍යයට සහ පරිසරයට සිදුවන අහිතකර බලපෑම් අවම කිරීමෙන් රජය අපේක්ෂා කරන සංවර්ධන ඉලක්කයන් කරා ළඟාවීමට දෙපාර්තමේන්තුව නියාමන ආයතනයක් ලෙස කටයුතු කරයි. එලෙස බලපෑම් ඇතිකරනු ලබන ආනයන හා අපනයන අයිතම හඳුනාගෙන ඒවා පාලනය හා නියාමනය කිරීම සඳහා ආනයන හා අපනයන බලපත්‍ර පාලනයට යටත් කිරීම, ආනයනය හෝ අපනයනය සම්පූර්ණයෙන්ම තහනම් කිරීම සහ ආනයන හා අපනයනයට අදාළ ප්‍රමිති නියම කිරීම අනෙකුත් රාජ්‍ය ආයතන සමඟ සම්බන්ධීකරණය වෙමින් නිසියාකාරව සිදුකරනු ලබයි.

සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති මාලාව අනුව රජය විසින් ගන්නා ලද ප්‍රතිපත්තිමය තීරණයක් වන ඉදිරි දශකය තුළ ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය කාබනික පොහොර භාවිතයට යොමු කිරීම සඳහා මෙම දෙපාර්තුමේන්තුව විසින් රසායනික පොහොර, කෘමිනාශක සහ වල්නාශක බලපත්‍ර පාලනයට යටත් කිරීම හා ආනයනය තහනම් කිරීමට අදාළව රෙගුලාසි පනවන ලදී. එලෙස ආනයනය සම්බන්ධව සීමා පැනවුවද අමාත්‍ය මණ්ඩල තීරණයට පටහැනි නොවන පරිදි, දේශීය කර්මාන්ත සඳහා අවශ්‍ය රසායනික ද්‍රව්‍ය ලබා දීමේ අරමුණින් හඳුනාගත් සංයෝජිත වර්ගීකරණ සංකේතාංක සඳහා බලපත්‍ර නිකුත් කිරීම සිදුකරන ලදී. රසායනික පොහොර, කෘමිනාශක සහ වල්නාශක ආනයනය සීමා කිරීමෙන් සෞඛ්‍යට සහ පරිසරයට සිදුවන්නා වූ අහිතකර බලපෑම අවම වීමත් කාබනික පොහොර භාවිතයට අවශ්‍ය පසුබිම සැකසීමට දායකත්ව සැපයීමෙන් තිරසාර පරිභෝජන හා නිෂ්පාදන රටාවක් සහතික කිරීමට හැකියාව ලැබේ.

බාසල් සම්මුතියේ මූලික ඉලක්කය වන අන්තරාදායක සහ අනෙකුත් අපද්‍රව්‍ය ජනනය, දේශ සීමා සංචලනය සහ කළමනාකරණය හේතුවෙන් ඇති විය හැකි අහිතකර බලපෑම්වලට එරෙහිව මිනිස් සෞඛ්‍ය සහ පරිසරය ආරක්ෂා කිරීම සඳහා නව රෙගුලාසි පනවා ආනයන හා අපනයන නියාමනය කරමින් මෙම දෙපාර්තමේන්තුවේ දායකත්වය රටට ලබා දෙනු ලබයි. ඒ අනුව, මෙම වසරේ දී පාවිච්චි කරන ලද ඇඳුම් සහ රෙදි සෝදන යන්ත්‍ර සඳහා බලපත්‍ර ලබානොදීමට  මෙම දෙපාර්තමේතුව කටයුතු කර ඇත.

**තිරසාර සංවර්ධනය සඳහා සාමකාමී සහ පරිපූර්ණ සමාජයක් ඇති කිරීම, යුක්තිය සඳහා සැමට අවස්ථාව ලබාදීම සහ සැම මට්ටමකට ඵලදායී , වගකීම් සහිත පූර්ණ ආයතන ගොඩනැගීම. (තිරසාර සංවර්ධන අරමුණු අංක 16)**

සියලුම මට්ටම්වල නිලධාරීන්ගේ ක්‍රියාකාරී සහභාගීත්වයෙන් යුත් තීරණ ගැනීමේ ක්‍රියාවලියක් ස්ථාපිත කිරීමත්, එම තීරණ නිරන්තර ඇගයීමයට භාජනය කිරීමෙන් ඉහළ සඵලත්වයක් තහවුරු කරගැනීම දෙපාර්තමේන්තුව ඉලක්ක කර ඇත. කාර්යමණ්ඩල රැස්වීම් සහ ප්‍රගති සමාලෝචන රැස්වීම් හරහා සියලුම මට්ටම්වල නිලධාරීන් තීරණ ගැනීමේ ක්‍රියාවලියට සක්‍රීයව හවුල්වීමෙන් ඵලදායී වගවීමෙන් යුක්ත හා විනිවිදභාවයෙන් යුත් ආයතනයක් පිහිටුවීමට හැකියාව ලැබී ඇත.

ජාතික නීති පද්ධතියට සහ අන්තර්ජාතික ප්‍රඥප්තීන්, ගිවිසුම්වලට අනුකූලව මහජනතාවට තොරතුරු ලබාගැනීමට ඇති අයිතිය පූර්ණ වශයෙන් තහවුරු වන ආකාරයට දෙපාර්තමේන්තුවෙන් අවශ්‍ය පහසුකම් එකී පාර්ශ්වයන් වෙත ලබා දී ඇත. දෙපාර්තමේන්තුවෙන් ඉල්ලුම් කරන ලද තොරතුරු ඉතා වගවීමෙන් සහ ඉතා ඉක්මනින් ඉල්ලුම් කරන පාර්ශ්වයන්ගේ අතට පත් කරනු ලබන අතර, දෙපාර්තමේන්තු වෙබ් අඩවිය හරහා ද යාවත්කාලීන තොරතුරු වෙතට පිවිසීමේ හැකියාව සලසා දී ඇත.

කොවිඩ් 19 ගෝලීය වසංගත තත්ත්වය පාලනය උදෙසා පනවන ලද සෞඛ්‍ය මාර්ගෝපදේශවලට අනුගතව මෙම දෙපාර්තමේන්තුව සීමිත මානව සම්පත් ධාරිතාවක් යටතේ වැඩ කටයුතු පවත්වා ගෙන යන ලදී. එමනිසා, 2021 වර්ෂය තුළ සැලසුම් කළ ක්‍රියකාරකම් සැලසුම් කල ආකාරයට  නියමිත කාලයේදී සම්පූර්ණ කිරීමට නොහැකි වූ අවස්ථා ද විය. මේ අතර ප්‍රගති සමාලෝචන රැස්වීම් 12 ක් පැවැත්වීමට සැළසුම් කර තිබුණද කොවිඩ් තත්ත්වය හමුවේ එකී රැස්වීම් වලින් 8 ක් නියමිත පරිදි පැවැත්වීමට හැකි විය. තොරතුරු දැනගැනීමේ පනත යටතේ සිදුකරන ලද ඉල්ලීම්වලට පිළිතුරු සැපයීම අභියෝගයක් වුව ද ඊට කඩිනමින් පිළිතුරු සැපයීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලදී.

| ඉලක්කය / අරමුණ | ඉලක්ක | ජයග්‍රහණ දර්ශකය | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | 0%-49% | 50%-75% | 75%-100% |
| **11.** නගර සහ ජනාවාස පරිපූර්ණ, ආරක්ෂිත, සවිමත් සහ තිරසාර ලෙස සකස් කිරීම. | 11.6 2030 වන විට විශේෂයෙන්ම වාතයේ ගුණාත්මකභාවය සහ නාගරික සහ වෙනත් අපද්‍රව්‍ය කළමනාකරණය ඇතුළත්ව නගර නිසා සිදු වන ඒක පුද්ගල අහිතකර පරිසර බලපෑම අඩු කිරීම. | 1.ප්‍රමිතීන්ට අනුකූල නොවන වාහන නිෂ්කාශනය කිරීමට ඉඩ නොදීම. | | | ✓ |
| **12.** තිරසාර පරිභෝජන සහ නිෂ්පාදන රටාවන් සහතික කිරීම. | 12.4 2020 වන විට එකඟතාවයට පත් වී ඇති අන්තර්ජාතික වැඩසැලැස්මට අනුකූලව පරිසර හිතකාමී අන්දමට රසායනික ද්‍රව්‍ය හා සියලුම අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම ක්‍රියාවට නංවීම සහ එමඟින් මානව සෞඛ්‍යට සහ පරිසරයට සිදුවන්නා වූ අහිතකර බලපෑම අවම කිරීම සඳහා වාතයට, ජලයට සහ පසට ඒවා මුදා හැරීම අවම කිරීම. | 2. බාසල් සම්මුතිය සමාලෝචනය සම්පූර්ණ කිරීම. | | ✓ | |
| | | 3. අදාළ අධිකාරියේ නිර්දේශය මත පාලනය කරන ලද අයිතම ගණන. | | | ✓ |
| | | 4. ඇල්මක් ඇති පාර්ශවයන් සමග පවත්වන ලද උපදේශන රැස්වීම් ගණන. | | ✓ | |
| | | 5. මාණ්ඩලික නිලධාරීන් සමග පවත්වන ලද උපදේශන රැස්වීම් ගණන. | | | ✓ |
| | | 6. දැනුවත් කිරීම් සඳහා සිදු කරන ලද ක්‍රියාකාරකම් ගණන. | | | ✓ |
| | 12.5 2030 වන විට අපද්‍රව්‍ය උත්පාදනය වීම වැළක්වීම, අඩු කිරීම, ප්‍රතිචක්‍රීකරණය සහ ඒවා නැවත භාවිතා කිරීම මඟින් අඩු කිරීම. | 7. විද්‍යුත් අපද්‍රව්‍ය ආනයනය අඩු කිරීම සඳහා වර්ෂය තුළ නිකුත් කරන ලද රෙගුලාසි ගණන. | ✓ | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | 8. ප්‍රතික්ෂේප කරන ලද ආනයනික භාවිතා කළ ඉලෙක්ට්‍රොනික අයිතම ගණන (ජංගම දුරකථන, පරිගණක.. ආදිය). | | | ✓ |
| **16. තිරසාර සංවර්ධනය සඳහා සාමකාමී සහ පරිපූර්ණ සමාජයන් ඇති කිරීම, යුක්තිය සඳහා සැමට අවස්ථාව ලබාදීම සහ සැම මට්ටමකම ඵලදායි, වගකීම් සහිත පරිපූර්ණ ආයතන ගොඩනැගීම.** | 16.7සියලුම මට්ටම්වලදී ප්‍රතිචාරාත්මක, සියලුදෙනා අන්තර්ගතවූ, සහභාගීත්වයෙන් යුත් සහ නියෝජනයෙන් යුත් තීරණ ගැනීමේ ක්‍රියාවලියක් පැවතීම තහවුරු කිරීම. | 9. පවත්වන ලද කාර්ය මාණ්ඩල රැස්වීම් ගණන. | | | ✓ |
| | | 10. පවත්වන ලද ප්‍රගති සමාලෝචන රැස්වීම් ගණන. | | ✓ | |
| | 16.10 ජාතික නීති පද්ධතියට සහ අන්තර්ජාතික ප්‍රඥප්තීන්, ගිවිසුම්වලට අනුකූලව මහජනතාවට තොරතුරු ලබා ගැනීමට ඇති අයිතිය තහවුරු කිරීම සහ මූලික නිදහස ආරක්ෂා කිරීම තහවුරු කිරීම. | 11. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනත යටතේ කළ ඉල්ලීම් මත දින 14 ක් තුළ ලබාදුන් පිළිතුරු ගණන. | | | ✓ |
| | | 12.තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනතට අනුව දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ වරින් වර පළ කරන ලද වාර්තා, සංඛ්‍යාලේඛන සහ ප්‍රකාශන ගණන. | ✓ | | |

## 5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

කොවිඩ් 19 ගෝලීය වසංගත තත්ත්වය පාලනය උදෙසා පනවන ලද සෞඛ්‍ය මාර්ගෝපදේශවලට අනුගතව මෙම දෙපාර්තමේන්තුව සීමිත මානව සම්පත් ධාරිතාවක් යටතේ වැඩ කටයුතු පවත්වා ගෙන යාමට සිදුවීම 2021 වර්ෂය තුළ  දෙපාර්තමේන්තුව මුහුණ දුන් විශාලතම අභියෝගයකි. නිලධාරීන්ගේ පැමිනීම සීමා වූව ද ආනයන හා අපනයන බලපත්‍ර ලබා ගැනීමට කරන ලද ඉල්ලීම් අඩු වූයේ නැත. දෙපාර්තමේන්තුවට නොපැමිණ මාර්ගගත ක්‍රමයට ඉලලුම්පත්‍ර ඉදිරිපත් කිරීම ද එයට හේතු විය. මේ නිසා සීමා සහිත මානව සම්පත් ධාරිතාවය යටතේ නිලධාරීන්ට අප්‍රමාද අඛණ්ඩ සේවාවක් සැපයීමට මුල්තැන දීමට සිදුවීම නිසා ඇතැම් සැලසුම් නියමිත කාලයේදී ක්‍රියාත්මක කිරීම අභියෝගයක් විය. එහෙත් සිමාකාරී තත්ත්වයක් යටතේ වුවද තිරසාර සංවර්ධන ඉලක්කයන් ළඟා කරගැනීමට මහත් වූ පරිශ්‍රමයක් දරන ලදී. මෙම ගැටලු යම්දුරකට සමනය කිරීම උදෙසා නවීන තාක්ෂණික ක්‍රමවේද ඔස්සේ සේවකයන්ගේ දායකත්වය ලබාගනිමින් මෙහෙයුම් කටයුතු සිදු කිරීම හරහා  සේවාලාභීන්ට මනා කාර්යක්ෂම සේවාවක් ලබා දීමට හැකිවීම අප ලද ජයග්‍රහණයකි.

තවද, තිරසාර සංවර්ධන ඉලක්ක කරා ළගා වීමට  දෙපාර්තමේන්තුව වෙත ඇති කාර්යභාරය ඉටු කිරීමේදී වෙනත් රාජ්‍ය ආයතන සමග සම්බන්ධීකරණය වෙමින් කටයුතු කිරීමට සිදුවේ. එහිදී, යම් යම් කාර්යයන් එම රාජ්‍ය ආයතනවලට පැවරෙන අතර එම කාර්යයන් ඉටු කිරීමේ ප්‍රගතිය දෙපාර්තමේන්තුවේ ඉලක්ක සැපිරීම කෙරෙහි තීරණාත්මකව බලපානු ලබයි. එම රාජ්‍ය ආයතන, එකී කාර්යයන් ඉටු කිරීම කෙරෙහි දක්වන ප්‍රගතිය අප දෙපාර්තමේන්තුවේ පාලනයෙන් බැහැර කරුණක් වන අතර එය මුහුණ දීමට සිදුව ඇති තවත් අභියෝගයකි. දෙපාර්තමේන්තුව මහත් පරිශ්‍රමයක් දරමින් මෙම අභියෝගයන් ජයගෙන තිරසාර සංවර්ධන කරා ගමන් කරමින් සිටි. එම රාජ්‍ය ආයතන, එකී කාර්යයන් ඉටු කිරීම කෙරෙහි දක්වන ප්‍රගතිය අප දෙපාර්තමේන්තුවේ පාලනයෙන් බැහැර කරුණක් වන බැවින් එය මෙම දෙපාර්තමේන්තුවට මුහුණ දීමට සිදුව ඇති තවත් එක් අභියෝගයකි. දෙපාර්තමේන්තුව තම උපරිම දායකත්වය ලබා දෙමින් මෙකී අභියෝගයන් ජයගෙන තිරසාර සංවර්ධන කරා ගමන් කරමින් සිටි.

# 6 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

## 6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය ආනයන හා අපනයන නියාමනයට අදාළ ප්‍රතිපත්ති සකස් කිරීම, බලපත්‍ර නිකුත් කිරීම/හර කිරීම සහ ආදායම් එක්රැස් කිරීම යන කාර්යයන් ඉටුකිරීම සඳහා තම සක්‍රීය දායකත්වය ලබාදෙන අතර, වඩා කාර්යක්ෂම හා ඵලදායී සේවාවක් සේවාලාභීන් වෙත සැපයීම සඳහා වගවීමෙන් හා කැපවීමෙන් යුතුව කටයුතු කරයි.

| තනතුර,සේවය හා ශ්‍රේණිය | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු/ (අතිරික්ත)** |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 13 | 09 | 04 |
| තෘතීය ශ්‍රේණිය | 04 | 02 | 02 |
| ද්විතීය | 75 | 65 | 10 |
| ප්‍රාථමික | 20 | 15 | 05 |
| **එකතුව** | **112** | **91** | **21** |

## 6.2 දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයේ බලපෑම

දෙපාර්තමේන්තුවේ පවත්නා සේවක පුරප්පාඩු පිරවීම සඳහා කටයුතු කරන ලෙස කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීම් ඉදිරිපත් කර ඇත. තවද, මානව සම්පත් හිඟය පූර්ණය කර ගැනීමට පහත ක්‍රියාමාර්ග ගන්නා ලදී.

- දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු පැවති පරිපාලන නිලධාරි තනතුර සඳහා වැඩ බැලීමේ පදනම මත පරිපාලන නිලධාරියෙකු පත් කිරීම.
- මෙම දෙපාර්තමේන්තුවේ පුහුණුව ලබන අභ්‍යාසලාභී උපාධිධාරි පුහුණු නිලධාරින් 11 දෙනාගේ ස්ථිර පත්වීම මෙම දෙපාර්තෙමේන්තුව වෙත ලබා දෙන ලෙස ඉල්ලා 2021.12.30 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ලිඛිතව දන්වන ලදී.
- නීති නිලධාරි තනතුර සඳහා අනුමැතිය ඉල්ලීම.

එහෙත් මෙතෙක් සම්පූර්ණ සේවක පුරප්පාඩු සංඛ්‍යාව පිරවීමක් සිදුනොවීම මත දෙපාර්තමේන්තු කාර්යසාධනය කෙරෙහි යම් බලපෑමක් ඇති කිරීමට හේතු වුවද, නිසි මානව සම්පත් කළමනාකරණය මත 2021 වර්ෂයේ දෙපාර්තමේන්තු කාර්යසාධනය අපේක්ෂිත මට්ටමට ළඟා වීමට හැකි වී ඇත.

## 6.3 මානව සම්පත් සංවර්ධනය

පෙර වර්ෂයේ මෙන්ම 2021 වර්ෂයේත් රටතුළ ව්‍යාප්තව පැවති කොවිඩ් - 19 ගෝලීය වසංගත තත්වයේ සමනය වීමක් සිදු නොවූ බැවින් සැලසුම් කර තිබූ පුහුණු වැඩසටහන් බොහොමයක් ක්‍රියාත්මක කිරීමට සුදුසු වාතාවරණයක් නොවීය.

එසේ වුවත්, 2021 වර්ෂයේ සමූහ පුහුණු වැඩසටහන්වලින් ඉවත්ව එකල හා කුඩා කණ්ඩායම් සඳහා නියමිත සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රමවේදයන්ට අනුකූලව දෙපාර්තමේන්තුවේ මානව සම්පත් සංවර්ධනය හා සෘජුවම බැඳෙන පහත සඳහන් කර ඇති වැඩසටහන්/පාඨමාලා සඳහා සේවකයන් යොමු කරවන ලදී.

| වැඩසටහන හෝ පාඨමාලාවේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව | සමස්ත ආයෝජනය (Rs'000) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය හා විදේශීය) | නිමැවුම/ ලබාගත් දැනුම |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව | 01 | 2021/2022 | 40,000.00 | - | දේශීය | ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාව වර්ධනය වීම. |
| රියදුරු හා කාර්යාල කාර්යය සහායක (කා. කා. ස.) සේවකයින් සඳහා රාජකාරී, ආගන්තුක සත්කාර හා ආචාරධර්ම පුහුණු වැඩසටහන | 07 | 2021.03.27 | 25,189.00 | - | දේශීය | රියදුරු හා කා. කා. ස සේවකයින්ගේ සේවාවේ ගුණාත්මකභාවය ඉහළ යාම. |
| වරලත් මානව සම්පත් කළමනාකරණ පාඨමාලාව | 01 | 2021.06.3–2021.07.31 | 165,000.00 | - | දේශීය | මානව සම්පත කළමනාකරණය පිළිබඳ දැනුම හා කුසලතා වර්ධනය වීම. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| මාර්ගගත ක්‍රමය හරහා මූල්‍ය ආතතිය යටතේ ඵලදායී මුදල් කළමනාකරණය පිළිබඳ පාඨමාලාව (SARTTAC) | 02 | 2021.08.02-2021.08.06 | - | - | විදේශීය | කොවිඩ් - 19 වැනි ආතති ආර්ථික තත්ත්වයක් යටතේ ආයතනයේ මූල්‍ය කළමනාකරණය හා සැලසුම්කරණය සිදු කරන ආකාරය පිළිබඳ දැනුම්වත් වීම. |
| සංවර්ධන අධ්‍යයන පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (MDS) | 01 | 2021/2022 | 120,000.00 | - | දේශීය | සංවර්ධන අධ්‍යයන පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ලැබීම. |

**6.3.1 - රියදුරු හා කාර්යාල කාර්යය සහායක (කා. කා. ස.) සේවකයින් සඳහා රාජකාරි, ආගන්තුක සත්කාර හා ආචාර ධර්ම පුහුණු වැඩසටහන**

දෙපාර්තමේන්තුවේ රියදුරු සහ කා.කා.ස සේවකයින් සඳහා ආයතන ක්‍රියාවලිය, ආගන්තුක සත්කාර හා ආචාර ධර්ම පිළිබඳව දැනුවත් භාවය යාවත්කාලීන කිරීමේ අවශ්‍යතාවය දෙපාර්තමේන්තුව විසින් හඳුනා ගන්නා ලදී.

ඒ අනුව දෙපාර්තමේන්තුවේ සම්පත් දායකත්වයෙන් රාජකාරි, ආගන්තුක සත්කාර හා ආචාර ධර්ම පුහුණු වැඩසටහනක් රියදුරු සහ කා. කා. ස සේවකයින් සඳහා සංවිධානය කර පවත්වන ලදී.

**6.3.2 - දෙපාර්තමේන්තුව විසින් සහභාගී වූ මාර්ගගත වැඩසටහන්**

එක්සත් ජාතීන්ගේ සාමය හා නිරායුධකරණය පිළිබඳ ආසියා ශාන්තිකර කලාපීය මධ්‍යස්ථානය මඟින් සංවිධානය කරන ලද දකුණු ආසියාවේ එක්සත් ජාතීන්ගේ ආරක්ෂණ මණ්ඩල යෝජනා 1540 ක්‍රියාත්මක කිරීම ශක්තිමත් කිරීම සඳහා මාර්ගගත ක්‍රමය හරහා පුහුණු වැඩසටහනක් පවත්වන ලදී. එම දේශන වඩාත් සාර්ථක අන්දමින් අවබෝධකර කර ගැනීම සඳහා අවශ්‍ය වන උපකාරක ලියවිලි සහ වීඩියෝ වැඩසටහන් සපයන ලදී. මේ සඳහා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 05 ක් ඒ සඳහා සහභාගී වන ලදී.

## 7 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 1 | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | | |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | | |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම (වාණිජ අත්තිකාරම් ගිණුම) | අදාළ නොවේ | | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම | අදාළ නොවේ | | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම | අදාළ නොවේ | | |
| 1.6 | වෙනත් | - | | |
| 2 | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම් (මු.රෙ.445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීනකර පවත්වා ගෙන යාම | අනුකූල වේ | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | | |
| 2.5 | සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | | |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GA - N20) යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 03 | **මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මූ.රෙ.135)** | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම | අනුකූල වේ | | |
| 3.2 | මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල වේ | | |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරින් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම | අනුකූල වේ | | |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම. | අනුකූල වේ | | |
| 4 | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 5 | **විගණන විමසුම** | | | |

| | | | | |
|---|---|---|---|---|
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියලුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම | අනුකූල නොවේ | කොරෝනා වසංගතය හේතුවෙන් අංශ වෙතින් පිළිතුරු ප්‍රමාද වීම. | නිශ්චිත කාල සීමාව තුළ පිළිතුරු සැපයීමට නිලධාරින් දැනුම්වත් කිරීම. |
| 6 | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු.රෙ.134(2) DMA/ 1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම | අනුකූල නොවේ | කොරෝනා වසංගතය හේතුවෙන් අංශ වෙතින් පිළිතුරු ප්‍රමාද වීම. | නිශ්චිත කාල සීමාව තුළ පිළිතුරු සැපයීමට නිලධාරින් දැනුවත් කිරීම. |
| 6.3 | 2018 අංක 19 දරණ විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තුමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 7 | **විගණන හා කළමනාකරණ කමිටුව** | | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම | අනුකූල වේ | | |
| 8 | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම හා අපහරණය කිරීම පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| | ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදයේ ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම | අනුකූල වේ | | |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම | අනුකූල වේ | | |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම | අනුකූල වේ | | |
| 9 | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම | අනුකූල වේ | | |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරික්ෂා කිරීම | අනුකූල වේ | | |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම | අනුකූල වේ. | | |

| | | | | |
|---|---|---|---|---|
| 10 | **බැංකු ගිණුම් කළමනාකරණය කිරීම** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශනවලින් අනාවරණය වූ හා ගැළපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 11 | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූල වේ | | |
| 11.2 | මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම | අනුකූල වේ | | |
| 12 | **රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන් වලට අනුකූල වීම | අනුකූල වේ | | |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම | අනුකූල වේ | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම | අනුකූල නොවේ. | සේවය අත්හිටවූ නිලධාරියෙක්ගේ ණය ශේෂ පැවතීම. | විනය නියෝග ලද පසු ණය ශේෂ සම්බන්ධ ඉදිරි කටයුතු සිදු කිරීම. |
| 13 | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම | අනුකූල වේ. | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 14 | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 14.2 | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල නොවේ | කොරෝනා වසංගතය හේතුවෙන් නිලධාරින් අඩුවෙන් සේවයට වාර්තා කිරීම. | ඉදිරියේදී එවැනි තත්ත්වයක් ඇති නොවීමට නිලධාරින් දැනුම්වත් කිරීම. |
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | අනුකූල වේ | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමග මාසිකව සැසඳුම් කිරීම | අනුකූල වේ | | |
| 15 | **අදායම් ගිණුම** | | | |
| 15.1 | අදාළ රෙගුලාසිවලට අනුකූලව, රැස් කළ අදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම | අනුකූල වේ | | |
| 15.2 | රැස් කොට තිබූ අදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම අදායම් ගිණුමට බැර කර තිබීම | අනුකූල වේ | | |
| 15.3 | මු.රෙ. 176 අනුව හිඟ අදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 16 | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම | අනුකූල වේ | | |
| 16.3 | 20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 17 | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| 17.1 | තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 17.2 | ආයතනය පිලිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| | පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා /චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම | | | |
| 17.3 | තොරතුරු දැනගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 18 | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම | අනුකූල වේ | | |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම | අනුකූල වේ | | |
| 19 | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම | අනුකූල වේ | | |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම | අනුකූල වේ | | |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හී දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම | අනුකූල වේ | | |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 20 | **විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | අනුකූල වේ | | |

## සමාප්ති සටහන

ගෝලීය වශයෙන් ව්‍යාප්තව පවතින කොවිඩ් - 19 වසංගත තත්ත්වය හේතුවෙන් මෙම වර්ෂයේදී මෙරට ආර්ථිකය ස්ථාවරව පවත්වාගෙන යාමෙහිලා රජයට විශාල අභියෝගයක් විය. මෙම තත්ත්වය පාලනයට රජය විසින් විවිධ ප්‍රතිපත්තිමය තීරණ ගනිමින් ආර්ථික කළමනාකරණය සඳහා මෙම දෙපාර්තමේන්තුව වෙත සුවිශේෂී වූ කාර්යභාරයක් පවරන ලදී.

විනිමය අනුපාතය මත ඇති වූ පීඩනය අවම කිරීමත් දේශීය නිෂ්පාදනයන් දිරිගන්වා ජාතික නිෂ්පාදනය ඉහළ නැංවීමත් මූලික කරගනිමින් ආනයන හා අපනයන සීමා කිරීම් හා තහනම් කිරීම්වලට අදාළව මෙම වසර තුළ අතිවිශේෂ ගැසට් නිවේදන කිහිපයක් ප්‍රකාශයට පත් කරන ලදී. ඒ තුළින් මෙරටින් විදේශයන්ට ඇදී යන විශාල විදේශ විනිමය ප්‍රමාණයක් ඉතිරි කර දීමට හැකිවීම අප දෙපාර්තමේන්තුව ලද ජයග්‍රහණයකි. එමෙන් ම දේශීය නිෂ්පාදකයාට ද තම නිෂ්පාදන සඳහා අවශ්‍ය වෙළඳපොළ තහවුරු කර දීමට හැකිවීමෙන් ඔවුන්ගේ නිෂ්පාදිත ප්‍රවර්ධනයට අවස්ථාව උදා කර දී ඇත.

මහජන සෞඛ්‍ය සුරක්ෂිත කිරීමේ අරමුණින් හා කාබනික පොහොර භාවිතය ඉහළ නැංවීමේ අරමුණින් රසායනික පොහොර, කෘමිනාශක හා වල්නාශක ආනයන පාලන රෙගුලාසි පැනවීමට කටයුතු කරන ලදී. ඒ හරහා හරිත ආර්ථිකයක් ඇති කිරීමෙහිලා මූලික අඩිතාලම සැපයීම සඳහා මෙම දෙපාර්තමේන්තුවේ දායකත්වය සැපයීමට හැකිවීම මහත් ගෞරවයකි.

කොවිඩ් - 19 වසංගතය තත්ත්වය හමුවේ දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් කටයුතු විවිධ බාධක මධ්‍යයේ වුවද අඛණ්ඩව පවත්වාගෙන යමින් වඩාත් ගුණාත්මක හා ඵලදායි සේවාවක් ලබා දීමට හැකි වීම අප ලද මහත් ප්‍රගතියකි. මෙම වසරේදී ආනයන හා අපනයන පාලන බලපත්‍ර ලබා ගැනීමට අවශ්‍ය අයදුම්පත් මාර්ගගත ක්‍රමය ඔස්සේ දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමේ පහසුකම, නව ආනයනකරුවන් ලියාපදිංචි කිරීම හා විද්‍යුත් ක්‍රමවේද හරහා ගෙවීම් කිරීමේ පහසුව සේවලාභින්හට පිරිනැමීමට හැකි වීම සුවිශේෂී කරුණකි.

තව ද සේවාලාභීන්ට ප්‍රතිපත්ති අංශය මගින් වඩා කාර්යක්ෂමව හා නිරවද්‍යතාවයෙන් යුතුව තම සේවාවන් ඉටුකරගැනීම පහසු කිරීමේ අරමුණින් අනුමැතීන් ලබා ගැනීම සඳහා නව ආකෘතීන් හඳුන්වාදීමත් තම සේවාලාභීන්ට මුහුණ දීමට සිදුවන දුෂ්කරතා මඟ හැරවීමේ අරමුණින් මේ දක්වා ප්‍රකාශයට පත්කර ඇති සියලු ගැසට් නිවේදනවල අඩංගු සීමා කරන ලද අයිතම හා ඊට අදාළ සංයෝජිත වර්ගීකරණ සංකේතාංකයන් ඒකාබද්ධ කරමින් සංයෝජිත වර්ගීකරණ සංකේතාංක මාර්ගෝපදේශයක් පිළියෙල කර ප්‍රකාශයට පත්කිරීමත් සිදුකර ඇත.

එමෙන්ම ඉහළ මූල්‍ය කාර්යසාධනයක් පවත්වා ගෙන යමින් හා පිරිවැය අවම මට්ටමකින් තබා ගෙන දෙපාර්තමේන්තුවේ පරිපාලන කටයුතු සාර්ථකව කළමනාකරණය සිදු කර ඇත. කොවිඩ් - 19 සෞඛ්‍ය මාර්ගෝපදේශ අනුව යමින් සේවකයන් සඳහා වැඩ කිරීමට සුදුසු පරිසරයක් ගොඩනගා ඇත.

රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ලබාදුන් නිර්දේශ අනුව සකස් කරන ලද නව සංයෝජිත වර්ගීකරණ සංකේතාංක ඇතුළත් කරමින් ජංගම වැඩපොළ රථ ආනයනය නියාමනය කිරීමට කටයුතු කිරීම ද මෙම වර්ෂය තුළ සිදුකරන ලද තවත් සුවිශේෂී කාර්යයක් වේ.

බාසල් සම්මුතියේ මූලික ඉලක්කයන් සපුරාලමින් මිනිස් සෞඛ්‍ය සහ පරිසරය ආරක්ෂා කිරීම සඳහා මෙම වසරේ දී පාවිච්චි කරන ලද ඇඳුම් සහ භාවිතා කරන ලද රෙදි සෝදන යන්ත්‍ර වැනි පරිසරයට හානිකරන ද්‍රව්‍ය සඳහා ආනයන බලපත්‍ර ලබානොදීමට ද මෙම දෙපාර්තමේතුව කටයුතු කර ඇත.

දෙපාර්තමේන්තුව එළඹෙන 2022 වර්ෂය තම සේවාලාභීන්ට වඩාත් ගුණාත්මකවූත් කාර්යක්ෂමවූත් සේවාවක් ලබා දීම උදෙසා අවශ්‍ය සේවා වැඩි දියුණු කිරීම් සිදු කිරීමට බලාපොරොත්තුවේ. ආයතනික දැක්ම අනුව ගමන් කරමින් රටේ අභිවෘද්ධියට දෙපාර්තමේන්තුවේ දායකත්වය උපරිමයෙන්ම ලබාදීම අපගේ ඉදිරි වසරේ අපේක්ෂාවයි.